වාර්ෂික වාර්තාව
ஆண்ட அறிக்கை
Annual Report

2014



තේ ශක්ති අරමුදල
தேயிலை சக்தி நிதி
Tea Shakthi FUND

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
பெருந்தோட்ட கைத்தொழில் அமைச்சு
Ministry of Plantation Industries



තේ ශක්ති අර්මුදල

"ඉර සේවය මෙන් සැමදා සේවයට"

වාර්ෂික වාර්තාව - 2014

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

පටුන

	පිටුව
1. හැඳින්වීම	2
2. දැක්ම, මෙහෙවර සහ තේ ශක්ති අරමුදලේ පරමාර්ථ	3
3. ලේකම්තුමාගේ පණිවිඩය	4-5
4. මූල්‍ය විශ්ලේෂණය	6
5. සංස්ථාපිත තොරතුරු	7
6. අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයන් සහ විධායක කාර්යය මණ්ඩලය	8-9
7. ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය	10-13
8. තේ ශක්ති ව්‍යාපෘති	14
9. මෙහෙයුම් සහ මූල්‍ය සමාලෝචනය කිරීම	15-29
10. ආදායම් විස්තරය	30
11. ශේෂ පත්‍රය	31
12. ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය	32
13. මුදල් ප්‍රවාහ ප්‍රකාශ	33
14. ගිණුම්කරණ ප්‍රතිපත්ති	34-44
15. ගිණුම්කරණ සටහන්	45-52
16. විගණකාධිපති වාර්තාව - 2014	

1. හැඳින්වීම

කුඩා තේ වතු හිමියන්ගේ සුභ සාධනය හා ආර්ථික තත්ත්වය නැංවීමෙහිලා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා සමස්ථ ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය එක්ව 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනත යටතේ තේ ශක්ති අරමුදල ස්ථාපනය කරන ලදී. වාණිජ ආයතනයක් ලෙස ස්ථාපනය කර ඇති තේ ශක්ති අරමුදලේ කාර්යාලය අංක 553/ A, මාදිවෙල පාර, තලවතුගොඩ පිහිටා ඇත.

තේ ශක්ති අරමුදල යනු කුඩා තේ වගාකරුවන්ගේ සම්පත් එක් කොට විශාල ප්‍රජාවකගේ සම්පූර්ණ විභවය එක් කිරීමේ අරමුණින් කුඩා තේ වතු හිමියන් විසින් අරමුදල් සපයන සහ අයිතිය සහිත සංවිධානයකි. තේ වගා කරනු ලබන කුඩා තේ වතු හිමියන් මිලියන 1.5 ක් ආවරණය කරමින් සමිති 1,200 ක් තුළ මෙම අරමුදල ක්‍රියාත්මක වේ.

තේ ශක්ති අරමුදලේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා පහත ක්‍රියාකාරකම් ඇතුලත් වේ.

1. තේ කර්මාන්තශාලා 13 ක් ලාභ ලබන උපාය මාර්ගික ව්‍යාපාරික ඒකක වශයෙන් මෙහෙය වීම.
2. ගුණාත්මකභාවය සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කර විශ්වාසනීයත්වය සහ නිසි වේලාවට සැපයීම වැනි දේ පවත්වා ගෙන තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය සහ දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය ලාභ ලබන තත්ත්වයෙන් පවත්වා ගෙන යාම.
3. තේ නිෂ්පාදනය කිරීම සහ දේශීය වෙළඳපොල තුළ කාර්යක්ෂම ලෙස බෙදා හැරීම.
4. කුඩා තේ වතු හිමියන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පවත්වා ගෙන යාම.
5. පොහොර ව්‍යාපෘතිය මඟින් ගුණාත්මක පොහොර කුඩා තේ වතු හිමියන් වෙත ලබා දීම.

මෙම කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ, තේ ශක්ති කර්මාන්තශාලා උපරිම ඵලදායිතාවෙන් සහ කාර්යක්ෂමතාවයෙන් යුතුව මෙහෙය වීම තුළ දළු නිපදවන්නන්ගේ කේවල් කිරීමේ ශක්තිය වැඩිදියුණු කිරීමෙන් කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික සහ සමාජයීය යහපත ඉහළ නැංවීමයි.

තේ ශක්ති පදනමේ කළමනාකාරීත්වය මෙම ප්‍රවර්තන වර්ෂය තුළ තම අරමුණු කොතරම් දුරට ළඟා කර ගෙන ඇතිද නැද්ද යන්න පිළිබඳවත්, මුහුණ දුන් අභියෝග පිළිබඳවත්, තර්ජනයන් පිළිබඳවත් සහ සත්‍ය වශයෙන්ම මෙම වසර තුළ සිදුවූ කරුණු සම්බන්ධයෙනුත් මෙම වාර්ෂික වාර්තාව ඔබට සාක්ෂි දරයි.

දැක්ම

කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික හා සමාජ පැවැත්මේ අභිවර්ධනයට කැපවූ විශිෂ්ඨම ආයතනය බවට පත් වීම

මෙහෙවර

තේ ශක්ති අරමුදලේ සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කාර්යක්ෂම හා සඵලදායීව තේ ශක්ති අරමුදල කළමනාකරණය කිරීම

තේ ශක්ති අරමුදලේ පරමාර්ථ

- කුඩා තේ වතු හිමියන්ගේ සිත් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ධාරණය කරවීම හා ඔවුන්ගේ ආර්ථික හා සාමාජයීය තත්ත්වය උසස් කරලීම.
- තේ කර්මාන්තයට අදාළව අවශ්‍යවන්නා වූ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
- තේ කර්මාන්තශාලා අත්පත් කර ගැනීම, සංවර්ධනය කිරීම හා කුඩා තේ වතු හිමියන්ගේ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වෙනත් පහසුකම් ලබා දීම.
- එම තේ කර්මාන්තශාලාවල නිෂ්පාදනයන් අලෙවි කිරීමේ කාර්යයන් වැඩි දියුණු කර සංවර්ධනය කිරීම.
- කුඩා තේ වතු හිමියන් වශයෙන් තේ නිෂ්පාදන කටයුතුවල නියැලී සිටින අයගේ සුභ සාධනය සඳහා අවශ්‍යවන්නා වූ කටයුතු සිදු කිරීම.
- වැවිලි කර්මාන්තය සඳහා අවශ්‍ය වන පොහොර ආනයනය කිරීම, නිෂ්පාදනය හා අලෙවි කිරීම.
- ශක්ති සම්පන්න ස්වයං මූල්‍ය සංවිධානයක් ලෙස පවත්වා ගෙන යාම.
- සාධ්‍ය වූ ලාභ උපදවන ස්ථිතියක් බවට පත් වීම සහ 10% ක ශුද්ධ ලාභ ප්‍රමාණයක් පවත්වා ගැනීම.
- 25% තිරසාර වර්ධනයක් අත්කර ගැනීම.
- අවදානම් හඳුනා ගැනීම සහ විධිමත් ලෙස කළමනාකරණය.

3. ලේකම්තුමාගේ පණිවිඩය

තේ ශක්ති අරමුදල 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනත යටතේ පිහිටුවන ලදී. ඉන් පසු 2016 වර්ෂයේදී ඇති වූ උග්‍ර කාරක ප්‍රාග්ධනය අර්බුදය හේතුවෙන් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 2016.06.21 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අංක අමප/16/1224/726/015-1 හා 2016.07.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල බලතල අත්හිටුවා එහි බලතල වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරන ලදී.

තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු එහි කාර්යයන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබන අතර, ඒ සඳහා තේ ශක්ති අරමුදලේ සේවය කළ සීමිත කාර්ය මණ්ඩලයක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත.

එසේම තේ ශක්ති අරමුදල යටතේ පැවති කර්මාන්තශාලා 12 ක් ද මාවරල වත්ත සහ හොරණ අරමණාගොල්ලේ පිහිටි පොහොර ගබඩා සංකීර්ණය බදු පදනම මත හෝ කළමනාකරණය පැවරීමේ පදනම මත බාහිර පාර්ශවයන් වෙත පැවරීමට කටයුතු කරන ලදී. ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු කම්හල්වලින් බදු වාරික මුදල් සහ කළමනාකරණ ගාස්තු තේ ශක්ති අරමුදල වෙත ලැබෙන අතර, ඉදිරියේදී කෙටි කාලීන වගකීම් සහ රුපියල් මිලියන 135 ක සුභසාධන රක්ෂණ අරමුදල ගොඩනැගීමෙන් පසු ඉතිරි මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත.

තේ ශක්ති අරමුදල 2014 වර්ෂයේදී පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

- 2014 වර්ෂයේදී තේ ශක්ති අරමුදලේ එවකට ක්‍රියාකාරීව පැවති කර්මාන්තශාලා 10ක් සඳහා කුඩා තේ වතු හිමියන්ගෙන් අමු දළු කිලෝ ග්‍රෑම් මිලියන 8.08 ප්‍රමාණයක් ලබාගෙන නිමි තේ කිලෝ ග්‍රෑම් මිලියන 1.69 නිෂ්පාදනය කර ඇත. එම තේ, තැරැව්කාර සමාගම් මඟින් අලෙවි කිරීමෙන් රු. මිලියන 556.47 ආදායමක් උපයා ගෙන ඇති අතර, එම ආදායම 2013 වර්ෂය සමඟ සැසඳීමේදී රු. මිලියන 149.27 ක අඩු වීමක් පෙන්නුම් කරනු ලැබේ.
- තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය රු. මිලියන 31.28 ක ආදායමක් උපයාගෙන ඇති අතර, එය 2013 සමඟ සැසඳීමේදී රු. මිලියන 1.03 කින් ඉහළ ගොස් ඇත.
- දේශීය තේ අලෙවි අංශයෙන් රු. මිලියන 2.65 ක ආදායමක් ලැබූ නමුත් 2013 වසර සමඟ සැසඳීමේදී එය රු. මිලියන 0.21 පහළ යාමක් පෙන්නුම් කරයි.
- ප්‍රවර්තන වර්ෂයේදී සියළු ආයෝජනවලින් රු. මිලියන 621.58 ක ආදායමක් උපයා ඇතත් එය 2013 වර්ෂය සමඟ සැසඳීමේදී රු. මිලියන 151.44 ක අඩු වීමක් පෙන්නුම් කරයි.

- තේ ශක්ති අරමුදල මඟින් ක්‍රියාත්මක වූ රක්ෂණ වන්දි ක්‍රමය සඳහා නව සාමාජිකයින් 22 දෙදෙනෙකු බඳවා ගෙන ඇත.
- ප්‍රවර්තන වර්ෂයේදී රක්ෂණ ප්‍රතිලාභ වශයෙන් සාමාජිකයින් 506 දෙනෙකු වෙත රු. මිලියන 9.47 ක මුදල් ගෙවා ඇත.

විධිමත් වතු අංශය අභිබවා සීඝ්‍රයෙන් තේ ක්ෂේත්‍රයෙහි සිය අනන්‍යතාවය තහවුරු කර ගත් කුඩා තේ වතු හිමියන් රටේ දරිද්‍රතාවය අඩු කිරීමට හා ජාතික ආර්ථිකයට ඇති දායකත්වය වටහා ගැනීමෙන් ඔවුන් සංවිධානත්මක තලයකට ගෙන ඒම අරමුණු කර ගත් තේ ශක්ති අරමුදල් සංකල්පය කොතරම් කාලීන හා අර්ථසම්පන්න වැඩ පිළිවෙලක් වුවත් පසුකාලීනව එහි කළමනාකාරීත්වයෙහි පැවති අඩුපාඩු නිසා අපේක්ෂිත අරමුණු කරා ළඟා නොවූ බව නිරීක්ෂණය වේ.

තේ ශක්ති අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම සහ කළමනාකරණ සංවර්ධනය ඉදිරි කාලයේදී සිදු කිරීමට හැකිවෙතැයි අපේක්ෂා කරමි.

බී. එල්. ඒ. ජේ. ධර්මකීර්ති
ලේකම්
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

4. මූල්‍ය විශ්ලේෂණය

2014 දෙසැම්බර් 31 දින දක්වා වසර තුනක මූල්‍ය කාර්ය සාධනයේ සාරාංශ

	2012	2013	2014
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
ආදායම	657.70	773.03	621.59
විකුණුම් පිරිවැය	(528.63)	(702.63)	(611.32)
දළ ලාභය	129.07	70.39	10.27
වෙනත් ආදායම්	161.77	44.69	44.08
විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	(8.54)	(17.87)	(15.51)
පරිපාලන වියදම්	(198.54)	(195.66)	(200.33)
ශුද්ධ මූල්‍ය වියදම්	(1.56)	4.67	(10.08)
රාජ්‍ය පරිත්‍යාග කපා හැරීම	50.63	43.75	43.75
ශුද්ධ ලාභය / අලාභය	82.20	(59.36)	(127.82)
ලාභාංශ	නැත	නැත	නැත
මුළු වත්කම්	935.00	882.45	758.47
කාරක ප්‍රාග්ධනය	184.01	119.00	63.39
ජංගම අනුපාතය	1:1.74	1:1.38	1: 1.9

2012, 2013 සහ 2014 ශේෂයන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රකාරව ගැලපීම් කිරීමෙන් පසු ඉදිරිපත් කර ඇත.

5. සංස්ථාපිත තොරතුරු

නම : තේ ශක්ති අරමුදල

ලිපිනය : අංක **553A**, මාදිවෙල පාර, තලවතුගොඩ

දු. ක. : 011-7421121

ෆැක්ස් : 011-2796537, 011-7421122

E-mail : tsf@teashakthi.gov.lk

සංස්ථාපන කිරීමේ පනත : 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනත

සංස්ථාපනය කිරීමේ වර්ෂය : 2000

ව්‍යාපාර ස්වභාවය

* තේ කොමසාරිස් රෙගුලාසි යටතේ තේ දළු මිලදී ගැනීමේ පදනම මත කුඩා තේ වතු හිමියන්ගෙන් අමු තේ දළු මිලදී ගෙන නිෂ්පාදනය කිරීමේ සහ නීත්‍යානුකූලව බලයලත් මාර්ග ඔස්සේ තේ විකිණීම.

* තේ වගාකරුවන්ට විශේෂයෙන් කුඩා තේ වතු හිමියන්ට ඉතා සුළු ලාභයක් තබා ගෙන නිර්දේශිත සූත්‍රයක් අනුව පොහොර ද්‍රව්‍ය මිශ්‍ර කර විකිණීම.

* පාරිභෝගිකයන් වෙනුවෙන් දේශීය වෙළඳපොලේ තේ මිශ්‍රණ බෙදා හැරීම.

විගණකවරු : රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරු : ලංකා බැංකුව

6. අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයින් සහ විධායක කාර්යය මණ්ඩලය

<u>අධ්‍යක්ෂ මණ්ඩලය</u>

1. නොඑල් පද්මසිරි කාරියවසම් මහතා - අධ්‍යක්ෂ/සභාපති, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
2. පූජ්‍ය උහනෝවිට විමලධම්ම හිමි - අධ්‍යක්ෂ (2014 ජනවාරි 22 සිට 2014 දෙසැම්බර් 31)
3. ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා - අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ, මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (2013 නොවැම්බර් 13 සිට 2014 දෙසැම්බර් 31)
4. කේ. ජී. බී. ඔබේසේකර මහතා - අධ්‍යක්ෂ/සමාන්‍යාධිකාරී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
5. නෙවිල් රත්නායක මහතා - අධ්‍යක්ෂ/සභාපති, සමස්ථ ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය
6. ජේ. එම්. බී. ජේ. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ/සභාපති, රත්නපුර කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
7. ඩබ්. ආර්. එස්. කරුණාරත්න මහතා - අධ්‍යක්ෂ/සභාපති, නුවරඑළිය කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
8. ආර්. එම්. ගුණසේකර මහතා - අධ්‍යක්ෂ /සභාපති, බදුල්ල කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
9. බී. ජී. අබේසිංහ මහතා - අධ්‍යක්ෂ/සභාපති, මහනුවර කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
10. පී. එච්. සුසන්ත ද සිල්වා මහතා - අධ්‍යක්ෂ/සභාපති, ගාල්ල කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
11. කේ. එල්. ගුණරත්න මහතා - අධ්‍යක්ෂ/සභාපති, කළුතර කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
12. පී. ආර්. ඒ. රත්නායක මහතා - අධ්‍යක්ෂ/සභාපති, කෑගල්ල කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
13. එම්. එෆ්. එස්. ඩබ්. ස්ටෙම්බෝ මහතා - උපදේශක/එම් පී අයි කළමනාකරණ අධ්‍යක්ෂ සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම
14. එස්. එස්. බී. ඩී. ජයවර්ධන මහතා - නිරීක්ෂක/සභාපති, තේ පර්යේෂණ ආයතනය, තලවකැලේ
15. ඊ. ඒ. ජේ.කේ. එදිරිසිංහ මහතා - නිරීක්ෂක/තේ කොමසාරිස්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය
16. කේ. ජී. ඩී. ඩී. අබේසුන්දර මහතා - නිරීක්ෂක/සභාපති, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම
17. පී. ඩබ්. ඩී. පී. සේනානායක මහතා - නිරීක්ෂක/ප්‍රධාන ගණකාධිකාරී, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
18. සරත් සිරිසේන මහතා - නිරීක්ෂක, ලංකා කොමෝඩිටි බ්‍රෝකර්ස් පුද්ගලික ආයතනය
19. ඒ. එච්. සුනිල් ගුණවර්ධන මහතා - අධ්‍යක්ෂ (තාවකාලික)/නියෝජ්‍ය අධ්‍යක්ෂ, මුදල් අමාත්‍යාංශය (2014 නොවැම්බර් 21 සිට 2014 දෙසැම්බර් 23)
20. එම්. බී. සිරිල් මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන), කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
21. සී. ජේ. අයි. ටී. ප්‍රනාන්දු මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සේවා දිගු), කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (2014 ඔක්තෝබර් 02 සිට 2014 දෙසැම්බර් 31)

විගණන සහ කළමනාකරණ කමිටුව

1. ජී. ඩබ්. ඩී. පී. සේනානායක මහතා - සභාපති, විගණන සහ කළමනාකරණ කමිටුව
2. ආර්. යූ. පී. ආර්. සිරිවර්ධන මහතා - කැඳවුම්කරු, විගණන සහ කළමනාකරණ කමිටුව
3. ඒ.එම්. පී. එම්. බී. අතපත්තු මහතා - සාමාජික, විගණන සහ කළමනාකරණ කමිටුව
4. එම්. එෆ්. එස්. ඩබ්. ස්ටෙම්බෝ මහතා - සාමාජික, විගණන සහ කළමනාකරණ කමිටුව
5. නෙවිල් රත්නායක මහතා - සාමාජික, විගණන සහ කළමනාකරණ කමිටුව
6. ජේ. එම්.බී. ජේ. බණ්ඩාර මහතා - සාමාජික, විගණන සහ කළමනාකරණ කමිටුව
7. ඊ. ඒ. පී. ආනන්ද මහතා - සාමාජික, විගණන සහ කළමනාකරණ කමිටුව

විධායක නිලධාරීන්

1. ඒ. ජේ. එම්. පී.බී. අවිරුප්පොල මහතා - ප්‍රධාන විධායක නිලධාරී
2. පී. ජී. ආර්. තිස්ස මහතා - ප්‍රධාන ගණකාධිකාරී
3. එස්. ඩී. කේ. අතුකෝරල මහතා - ප්‍රධාන කළමනාකරු (සංවර්ධන)
4. එම්. එස්. එච්. මොහොට්ටි මහතා - අභ්‍යන්තර විගණක
5. ආර්. යූ. පී. ආර්. සිර්වර්ධන - කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන)
6. නිහාල් වීරසේකර මහතා - කළමනාකරු (පොහොර සහ දේශීය තේ අලෙවි)
7. ඩබ්.ඒ. ඒ. එස්. ජයසුන්දර මහතා - ගණකාධිකාරී
8. චමිල ජයවික්‍රම මහතා - අභ්‍යන්තර විගණන නිලධාරී
9. ඒ. එච්. සී. කේ. කරුණාරත්න මහතා - පරිගණක පද්ධති පරිපාලක
10. එම්. ඒ. ඉන්දිකරත්න මහතා - සුභසාධන නිලධාරී

මෙයට අමතරව ලුතිනන් කර්නල් (විශ්‍රාමික) ජී. එල්.එෆ්. මාෂල් මහතා කර්මාන්තශාලා උපදේශකවරයකු ලෙස රාජකාරී කටයුතු සිදු කරන ලදී.

7. ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය

තේ ශක්ති අරමුදලේ සේවය කළ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිලධාරිනිය විශ්‍රාම යාමෙන් පසු ඇති වූ පුරප්පාඩුව සඳහා අභ්‍යන්තර විගණක නිලධාරියකුට අමතරව අභ්‍යන්තර විගණන නිලධාරියකු සහ පරිගණක පද්ධති පාලකවරයකු අලුතින් බඳවා ගැනීම 2014 වර්ෂයේදී සිදු කරන ලදී.

මූලික ක්‍රියාකාරකම්

පහත දක්වා ඇති ව්‍යාපෘති තේ ශක්ති අරමුදල යටතේ ක්‍රියාත්මක කරන ලද අතර, එම ව්‍යාපෘතිවල ක්‍රියාකාරිත්වය පිළිබඳව පිළිවෙලින් පිටු අංක 17, 25, 26 හි සවිස්තරාත්මකව දක්වා ඇත.

1. කම්හල් ව්‍යාපෘතිය
2. පොහොර ව්‍යාපෘතිය
3. දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය

මෙහෙයුම් ආදායම

සමාලෝචිත වර්ෂයේදී කම්හල් ව්‍යාපෘතිය, දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය සහ පොහොර ව්‍යාපෘතිය අලාභ ලබන තත්ත්වයට පත් වී ඇත. මේ පිළිබඳව අවසන් ගිණුම් වාර්තාවේ පෙන්වා ඇත.

අනාගත සංවර්ධන වැඩසටහන්

තේ ශක්ති අරමුදල තුළ ක්‍රියාකාරී මට්ටමේ පවතින කම්හල් 10, පොහොර ව්‍යාපෘතිය හා දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය සංවර්ධනය සඳහා පහත කරුණු ක්‍රියාත්මක කිරීම සුදුසුය.

- නිමි තේවල ගුණාත්මය දියුණු කිරීම
- නව තාක්ෂණ භාවිතා කිරීම සහ නව යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දීම
- අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වා දීම
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන සහතික ලබා ගැනීමට අවධානය යොමු කිරීම
- දේශීය තේ අලෙවි අංශය සඳහා ගුණාත්මයෙන් යුත් තේ අලෙවි කිරීම සහ නව ගැණුම්කරුවන් හඳුනා ගැනීම
- කම්හල් මට්ටමින් සහ නව අලෙවි නියෝජිතයන් පත් කිරීම තුළින් පොහොර අලෙවිය වැඩි දියුණු කිරීම
- කොටස් කරුවන්ට හා කුඩා තේ වතු හිමියන්ට වැඩි ප්‍රතිලාභ ලබා දීම වැනි දේ සමඟ තරඟකාරීව කටයුතු කිරීමට සැලසුම් කිරීම.

ලාභ හා විසර්ජනයන්

2013 සහ 2014 සඳහා පිරිවැටුමේ සහ මෙහෙයුම් ලාභවල තොරතුරු පහත දැක්වේ.

	2013 (රු.)	**2014** (රු.)
තැරැව්කාර විකුණුම්වලින් ලද ආදායම	705,746,466.00	556,475,091.00
දේශීය තේ විකුණුම්	31,402,999.00	28,607,143.00
පොහොර විකුණුම්	30,572,963.00	31,277,680.00
අමු ද්‍රව්‍ය සෘජු ආදායම්	322,363.00	326,302.00
කසල තේ ආදායම	6,129,858.00	5,626,443.00
විකුණුම් වට්ටම	(818,847.00)	(722,985.00)
මුළු ආදායම	**773,033,440.00**	**621,589,674.00**
විකුණුම් පිරිවැය	(702,639,456.00)	(611,323,143.00)
දළ ලාභය	**70,393,984.00**	**10,266,531.00**
වෙනත් ආදායම්	44,692,274.00	44,085,060.00
පරිපාලන වියදම්	(195,661,407.00)	(200,329,899.00)
විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්	(17,870,755.00)	(15,508,944.00)
මුළු මෙහෙයුම් ලාභය	**(98,445,904.00)**	**(161,487,253.00)**
මූල්‍ය පිරිවැය	(4,670,387.00)	(10,086,984.00)
බදුවලට පෙර මෙහෙයුම් ලාභය	**(59,365,788.00)**	**(127,823,734.00)**
ආදායම් බදු	–	–
ශුද්ධ ලාභය/ අලාභය	**(59,365,788.00)**	**(127,823,734.00)**

ලාභාංශ සහ සංචිත

සමාලෝචිත වර්ෂය තුළ ලාභාංශ ප්‍රකාශයට පත් කර නැත.

සංස්ථාපිත ආධාර

2014 වර්ෂය තුළ රු. 25,550,000.00 ක මුදලක් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස ලැබී ඇත.

ප්‍රාග්ධන වියදම්

තේ ශක්ති අරමුදලෙහි දේපළ, යන්ත්‍ර සහ උපකරණ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 04 මඟින් දක්වා ඇත.

දායකත්ව ප්‍රාග්ධනය

රජයේ දීමනා	රු.	**437,505,030.00**
කොටස් ප්‍රාග්ධනය	රු.	**208,959,130.00**

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයන්ට අනුව ප්‍රවර්තන වර්ෂයට අදාළව රජයට සහ සේවකයන්ට ගෙවිය යුතු එම ගෙවීම් නිසි පරිදි සිදු කර තිබේ.

බදු ගිවිසුම්

මූල්‍ය ප්‍රකාශය තුළ ආදායම් බදු ඉදිරිපත් කර නොමැති අතර, තේ ශක්ති අරමුදල කෘෂි ක්ෂේත්‍රය සඳහා ලබා දී ඇති අවුරුදු 10 ක බදු නිදහස භුක්ති විඳියි.

අදාළ නීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් අනුකූලතාවය

මූල්‍ය ප්‍රකාශයන්හි අන්තර්ගත කළ යුතු වන්නා වූ ද්‍රව්‍යාත්මක මුදල් ගැලපීම්වලට මං පාදන හෝ තේ ශක්ති අරමුදලෙහි හෝ එහි බල සීමාවෙහි නීති හෝ රෙගුලාසි උල්ලංඝනය කරනු ලබන කිසිදු ක්‍රියාකාරකමක් හෝ එවැනි තත්ත්වයක් සිදුව නොමැති බව අපගේ උපරිම විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරමු.

අධ්‍යක්ෂ මණ්ඩලය

තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය පිටු අංක 8 හි දක්වා තිබේ.

කොන්ත්‍රාත් සහ යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධතාව

කිසිදු අධ්‍යක්ෂවරයෙක් සෘජුව හෝ වක්‍රව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් කිසිදු බැඳියාවක් නොදක්වයි.

අධ්‍යක්ෂවරු විසින් ඔවුන් වෙත යම් සබඳතාවක් හෝ විශේෂයක් සහිත කරුණු සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට සිදුවන අවස්ථාවන්හීදී එකී කටයුත්තට පෙර තම සබඳතාව හෝ විශේෂත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් අධ්‍යක්ෂවරු වෙත දැන්වීමට සහ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය වගබලා ගනී.

<u>පරිසර ආරක්ෂාව</u>

තේ ශක්ති අරමුදලේ සියළු ව්‍යාපාර ක්‍රියාකාරකම් කුමන හෝ ආකාරයකින් පරිසරයට බලපෑමක් නොකරයි. තේ ශක්ති අරමුදලේ ප්‍රතිපත්තිය වන්නේ, පරිසරයට සිදුවන හානිය අවම මට්ටමක පවත්වා ගැනීමත් අදාළ අධිකාරීන් සමඟ සබඳතා ප්‍රවර්ධනය කර ගැනීම සහ අදාළ රෙගුලාසිවලට අනුව කටයුතු කිරීමත්ය.

<u>ශේෂ පත්‍රයට පසු කටයුතු</u>

ශේෂ පත්‍රය සකස් කරන දිනට සිදු වෙමින් පැවති සිද්ධි නොවූ අතර, එම නිසා නැවත සකස් කිරීමක් හෝ මූල්‍ය ප්‍රකාශයේ පැහැදිලි කිරීමක් අවශ්‍ය නොවුණි.

<u>අඛණ්ඩ පැවැත්මේ සංකල්පය</u>

මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීමෙන් පසුව කුඩා තේ වතු හිමියන්ගේ මැදිහත් වීම, පුරෝකතන, අයවැය, ණය ගැනීමේ අවශ්‍යතා, පවත්නා බැරකම් සහ දරාගැනීමේ ශක්තිය, වෙනස් වන අවස්ථාවලට මුල්‍ය අනුකූලතාව, නිෂ්පාදන සහ වෙළඳපොල නැඹුරුව, කළමනාකරණ උපායමාර්ග, ශක්තීන් සහ දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ සලකා බලමින් ද්‍රව්‍යාත්මකව සිය මෙහෙයුම් කෙටි කර නොගනිමින් දෘෂ්‍ය අනාගතයේ සිය මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට තමා සතු සම්පත් යෝග්‍ය පරිදි ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තෘප්තිමත්ව සිටී. එබැවින්, මුල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය පදනම් කර ගනිමින් කටයුතු කිරීමට අපි කටයුතු කරමු.

<u>සියළු පාර්ශ්වකරුවන්ට සියළු ප්‍රකාශ සඳහා සර්වසාධාරණ සැළකීම</u>

අපගේ පාර්ශ්වකරුවන්ගේ අනුග්‍රහය අගය කරන අතරම සියළුම පාර්ශ්වකරුවන්ට සර්වසාධාරණ සැලකිල්ලක් ලබා දීමට තේ ශක්ති අරමුදල විසින් සියළු උත්සාහයන් ගෙන තිබේ.

<u>විගණන නිලධාරීන්</u>

වර්ෂ 2014 ක් වූ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 කොටසේ ප්‍රතිපාදනවලට අනුව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) කොටස අනුව විගණකාධිතිගේ උපදෙස් ප්‍රකාරව සිදු කරන ලදී.

8. තේ ශක්ති ව්‍යාපෘති

8.1. තේ ශක්ති තේ කර්මාන්තශාලා

1. බදුල්ල දිස්ත්‍රික්කය

- පස්සර තේ ශක්ති කම්හල - ඩී. එම්. එන්.පී. දිසානායක මහතා
  කර්මාන්තශාලා කළමනාකරු

2. නුවරඑළිය දිස්ත්‍රික්කය

- කැප්පෙටිපොළ තේ ශක්ති කම්හල - ආර්. ගොඩකන්දආරච්චි මහතා
  කර්මාන්තශාලා කළමනාකරු
- කොත්මලේ තේ ශක්තික කම්හල - ආර්. යූ. ජයසේකර මහතා
  කර්මාන්තශාලා කළමනාකරු

(මහවැලි සංවර්ධන අධිකාරියෙන් කුලී පදනම මත)

- මහවැලි තේ ශක්ති කම්හල - ආනන්ද ධනසිරි මහතා
  කර්මාන්තශාලා කළමනාකරු

3. කළුතර දිස්ත්‍රික්කය

- රයිගම් කෝරලේ තේ ශක්ති කම්හල - එස්. කේ. ඩී. අතුකෝරල මහතා
  කර්මාන්තශාලා කළමනාකරු

4. ගාල්ල දිස්ත්‍රික්කය

- ඇල්පිටිය තේ ශක්ති කම්හල - සම්පත් බණ්ඩාර මහතා
  කර්මාන්තශාලා කළමනාකරු
- වලහන්දුව තේ ශක්ති කම්හල - ඒ. ජේ. ආර්. සෙනෙවිරත්න මහතා
  කර්මාන්තශාලා කළමනාකරු
- හිනිදුම තේ ශක්ති කම්හල - සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා
  සමාගම වෙත පවරා ඇත.

5. රත්නපුර දිස්ත්‍රික්කය

- ගිලීමලේ තේ ශක්ති කම්හල - වසා දමා ඇත
- බලංගොඩ තේ ශක්ති කම්හල - වසා දමා ඇත
- පොතුපිටිය තේ ශක්ති කම්හල - යෝජිත

6. මාතර දිස්ත්‍රික්කය

- දෙනියාය තේ ශක්ති කම්හල - ඩී. ජී. නීල් ඩයස් මහතා
  කර්මාන්තශාලා කළමනාකරු
- මාවරල තේ ශක්ති කම්හල - එස්. මාගිනාරච්චි මහතා
  කර්මාන්තශාලා කළමනාකරු (වැ. බ.)

7. මහනුවර දිස්ත්‍රික්කය

- යටිනුවර තේ ශක්ති කම්හල - සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා
  සමාගම වෙත පවරා ඇත.

8. කෑගල්ල දිස්ත්‍රික්කය

- දැරණියගල තේශක්ති කම්හල - යූ. ජී. එන්. කුමාර මහතා
  කර්මාන්තශාලා කළමනාකරු
- බුලත්කොහුපිටිය තේ ශක්ති කම්හල - යෝජිත

8.2. පොහොර සහ දේශීය තේ අලෙවි ව්‍යාපෘති

- පොහොර සහ දේශීය තේ අලෙවි මාස්ථානය - නිහාල් වීරසේකර මහතා, කළමනාකරු
- මිශ්‍ර කිරීමේ කර්මාන්තශාලාව අරමණාගොල්ල, හොරණ
  - නිහාල් වීරසේකර මහතා, කළමනාකරු

9. මෙහෙයුම් සහ මූල්‍ය සමාලෝචනය කිරීම

2013 වර්ෂය සමඟ සැසඳීමේදී 2014 වර්ෂයේදී පරිපාලන වියදම් රු. මිලියන 4.67 කින් අඩු වී ඇති අතර, බෙදාහැරීම් වියදම් රු. මිලියන 2.36 කින් වැඩි වී ඇත.

9.1. කාණ්ඩමය දායකත්වය සහ මූල්‍ය කාර්ය සාධනය

කාණ්ඩමය දායකත්වය (රු. මිලි) 2013 - 2014

කාණ්ඩය	2014	2013	පරස්පරය
තේ තැරැව්කරුවන්ගේ අලෙවිය	556.47	705.74	(149.27)
දේශීය තේ අලෙවිය	28.60	31.40	(2.80)
පොහොර අලෙවිය	31.27	30.25	1.02

9.1.1. තැරැව්කරුවන්ගෙන් ලැබුණු නිමි තේ අදායම

පසුගිය වසර හා සැසඳීමේදී තේ තැරැව්කරුවන්ගෙන් ලැබුණ තේ අලෙවි ආදායම රුපියල් මිලියන 149.28 පහළ ගොස් ඇත. තේ අස්වැන්න අඩු වීම මත කම්හල්වලට ලැබුණු දළු ප්‍රමාණය පහළ යාම තුළින් කම්හල්වල නිෂ්පාදිත මුළු නිමි තේ ප්‍රමාණය අඩු වී ඇත. තවද, 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ නිෂ්පාදිත නිමි තේ සඳහා තේ වෙන්දේසියේ ලැබුණු මිල පහළ යෑම ද මේ සඳහා පාදක වී ඇත.

9.1.2. දේශීය තේ අලෙවියෙන් ලැබෙන අදායම

2014 වර්ෂයේ දේශීය තේ අලෙවි ආදායම රුපියල් මිලියන 28.60 වන අතර, පසුගිය වර්ෂයට සාපේක්ෂව එය රුපියල් මිලියන 2.80 ක පහළ යෑමකි. තේ අලෙවි ක්ෂේත්‍රයේ ඇති දුර්වලතා, අනෙකුත් තේ අලෙවි තරඟකරුවන් සමඟ තරඟ කිරීමේදී ඇති දුර්වල ක්‍රමෝපායන් හා පැරණි අලෙවි ක්‍රමෝපායන් අනුගමනය කිරීම අලෙවි ආදායම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත.

9.1.3. පොහොර ව්‍යාපෘතිවල ආදායම

පොහොර ව්‍යාපෘතිය මඟින් වර්ෂය තුළ රුපියල් මිලියන 31.27 ක අලෙවි ආදායමක් උපයා ඇති අතර, එය පසුගිය වසර හා සැසඳීමේදී රුපියල් මිලියන 1.02 ක ඉහළ යාමකි. ඉහළ ප්‍රමිතියකින් යුත් පොහොර නිෂ්පාදනය සඳහා වැඩි ඉල්ලුමක් ඇති වීම සහ පොහොර මිශ්‍ර කිරීම සඳහා වන වියදමේ අඩු වීම පොහොර ව්‍යාපෘතියේ අලෙවි ආදායම ඉහළ යාමට ප්‍රධාන සාධක වී ඇත.

9.1.4. මූල්‍ය කාර්ය සාධනය - **2012 - 2014**

විස්තරය	2014	2013	2012
ROCE %	16.85	6.73	8.8
GP Ratio %	1.65	9.1	19.6
ROA times	1 : (0.16)	1: (0.067)	1 : 0.90
ශුද්ධ ලාභ අනුපාතය	-20.56%	-7.68%	12.49%
දල ලාභය කිලෝග්‍රෑම් (රු)	0.60	33.15	63.48
ශුද්ධ ලාභය කිලෝග්‍රෑම්	(75.29)	27.96	40.43
මුළු වත්කම (රු)	758,475,681	882,457,653	935,066,212
ජංගම අනුපාතය	1:1.9	1:1.38	1:1.74

ඉහත වගුව මඟින් දක්වන මූල්‍ය අනුපාත අනුව 2012 සිට 2014 වර්ෂවල කාර්ය සාධනයේ අයහපත්ම වර්ෂය 2014 වර්ෂය බැව් නිරීක්ෂණය වේ.

තවදුරටත්, 2012 සිට 2014 වර්ෂය දක්වා ආදායම් සහ වියදම් ගිණුම්වල සාරාංශයන් මෙම තත්ත්වය ඉතා පැහැදිලිව දක්වා තිබේ.

9.1.4. ආදායම සහ සමස්ත ලාභදායීත්වය (රු.)

2014 වර්ෂයේදී නිමි තේ විකිණීමෙන් ලද ආදායම 2013 වර්ෂය සමඟ සැසඳීමේදී රු. මිලියන 149.27 කින් ආදායම අඩු වී ඇත. ඒ අනුව, සමස්තයක් වශයෙන් ගත්විට 2014 වර්ෂයේදී රු. මිලියන 15.1 ක අලාභයක් ලබා ඇත.

2014 වර්ෂයේදී 2013 වර්ෂයට වඩා නිමි තේ නිෂ්පාදනය අඩුවීම සහ අනෙකුත් විවිධ සාධක කාර්යක්ෂමව සහ ඵලදායීව කළමනාකරණය නොකිරීම එයට හේතුව ලෙස දැක්විය හැක.

9.2. තේ ශක්ති කර්මාන්තශාලා ව්‍යාපෘතිය

9.2.1. දළු සැපයුම සහ නිමි තේ නිෂ්පාදන

ප්‍රවර්තන වසරේ අප්‍රේල් සිට ජූලි දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ මුළු දිවයිනෙහිම වියළි කාළගුණික තත්ත්වයක් පෙන්නුම් කරන ලදී. උතුරු මැද සහ නැගෙනහිර පළාත්වලට මැයි මස වර්ෂාව ආරම්භ වන අතර, අගෝස්තු සිට දෙසැම්බර් දක්වා නිරිතදිග ප්‍රදේශවලට වර්ෂාව ලැබේ. පසුගිය වසර 05ක කාලය තුළ එක් එක් කර්මාන්තශාලාව සඳහා අමු දළු සැපයුම වාර්ෂික සංසන්දනයකින් යුක්තව පහත වගුවෙහි දැක්වේ.

අමු දළු මිලදී ගැනීම (කි. ග්‍රෑ.) 2010 සිට 2014 දක්වා

කර්මාන්තශාලාව	දළු මිලදී ගැනීම				
	2010	**2011**	**2012**	**2013**	**2014**
බලංගොඩ	884,746	361,250	වසා ඇත	-	-
හිනිදුම	988,307	538,928		-	-
පන්සල්තැන්න	424,476	471,726		-	-
දෙනියාය	1,506,140	1,310,992	1,074,155	907,490	713,628
ඇල්පිටිය	874,488	728,562	558,006	1,027,287	497,958
කැප්පෙටිපොල	1,251,739	1,137,382	1,204,787	1,447,584	965,544
කොත්මලේ	493,987	938,351	442,018	508,090	389,658
මහවැලි	1,410,220	2,099,827	1,601,808	1,081,351	856,455
මාවරල	856,827	827,292	537,241	400,610	267,805
පස්සර	1,491,534	1,405,541	1,299,076	1,363,587	948,561
රයිගම්කෝරලේ	1,637,597	1,891,541	1,446,959	1,355,290	1,538,794
වලහන්දුව	1,244,025	1,264,174	1,168,658	1,144,529	683,708
දැරණියගල		-	192,832	882,710	1,222,146
එකතුව	**13,064,086**	**12,975,566**	**9,525,540**	**10,118,528**	**8,084,257**

ඉහත දක්වා ඇති වගුව අනුව වසර 05 තුළ රයිගම්කෝරලේ සහ දැරණියගල කම්හල හැර අනෙකුත් සියළුම කම්හල් අඩු දළු මිලදී ගැනීමක් වාර්තා කොට ඇති වර්ෂය සමාලෝචිත වර්ෂය වන අතර, 2012 අග භාගයේ ආරම්භ කරන ලද දැරණියගල කම්හල වාර්ෂිකව දළු සැපයීම වර්ධනය කර ගෙන ඇති බැව් නිරීක්ෂණය වේ. දෙනියාය, මාවරල හා වලහන්දුව කර්මාන්තශාලාවල අඛණ්ඩව දළු සැපයීම අඩු වී ඇති බැව් නිරීක්ෂණය වන අතර, අනෙකුත් කර්මාන්තශාලාවල වර්ෂිකව දළු සැපයීම උච්ඡාවචනය වී ඇත.

වැඩිම තේ දළු ගැණුම් ප්‍රමාණය වන කි. ග්‍රෑ. 2,099,827 මහවැලි තේ ශක්ති කර්මාන්තශාලාවෙන් 2011 වසරේදී වාර්තා වූ අතර, අඩුම දළු තේ ගැණුම් ප්‍රමාණය වන කි. ග්‍රෑ. 192,832 ක ප්‍රමාණය 2012 වසරේදී දැරණියගල තේ ශක්ති තේ කර්මාන්තශාලාවෙන් වාර්තා විය.

දැරණියගල තේ ශක්ති තේ කර්මාන්තශාලාව 2012 ඔක්තෝබර් මස ආරම්භ වූ අතර, එම කෙටි කාලය තුළ ඔවුන්ට අවශ්‍ය තරම් දළු ප්‍රමාණයක් ලබා ගැනීමට නොහැකි විය. කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමත්, පුහුණු ශ්‍රමිකයන් ආකර්ෂණය කර ගැනීමත් තේ පරීක්ෂකවරුන්, කලාප කළමනාකරුවන්, ප්‍රාදේශීය දේශපාලන අධිකාරිය සහ තේ තැරැව්කරුවන් සමඟ යහපත් සබඳතා ගොඩනගා ගැනීමත් ආදිය මඟින් තේ ශක්ති කම්හල් සඳහා ලබා ගන්නා දළු ප්‍රමාණය වැඩි කර ගැනීම කළ හැක. 2014 වර්ෂය ඔවුන් වාර්තා කළ දළු ගැණුම් ප්‍රමාණය වන කි.ග්‍රෑ. 1,222,146 ක ප්‍රමාණය සැලකිය යුතු වර්ධනයකි.

නිමි තේ (කි. ග්‍රෑ.) 2010 සිට 2014 දක්වා

කර්මාන්තශාලාව	නිමි තේ				
	2010	**2011**	**2012**	**2013**	**2014**
බලංගොඩ	189,991	74,291	වසා ඇත	-	-
හිනිදුම	197,829	106,607		-	-
පන්සල්තැන්න	89,478	104,899.5		-	-
දෙනියාය	310,725	269,055	218,364	184,519	146,651
ඇල්පිටිය	178,077	148,021.5	118,400	216,272	102,435
කැප්පෙටිපොල	273,322	243,507	261,056	309,395	206,235
කොත්මලේ	103,042	200,027	99,200	107,593	80,351.5
මහවැලි	301,755	458,806	351,989	228,485	188,065
මාවරල	175,756	171,257	111,197	82,126	55,380
පස්සර	328,441	307,929	290,487	298,578	209,097
රයිගම්කෝරලේ	348,710	400,380	300,603	275,321	316,688
වලහන්දුව	257,831	260,930.5	241,296	238,541	141,814
දැරණියගල			40,599	182,312	250,966.5
එකතුව	**2,754,957**	**2,745,711**	**2,033,191**	**2,123,142**	**1,697,683**

2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වන පසුගිය වසර පහ සඳහා වාර්ෂික සංසන්දනාත්මක නිමි තේ ප්‍රමාණයන් ඉහත වගුවේ දක්වා තිබේ.

ඉහත දක්වා ඇති වසර 05 තුළ අඩුම නිමි තේ ප්‍රමාණය සමාලෝචිත වර්ෂය තුළ නිෂ්පාදනය කර ඇති අතර, ඒ සඳහා දළු සැපයුම අඩු වීම හා නිමි තේ නිෂ්පාදන ප්‍රතිශතය (made tea output ratio) පහළ යෑම ප්‍රධාන වශයෙන් පාදක වී ඇත. වර්ෂ 05 තුළම වාර්ෂිකව නිෂ්පාදනය කළ අඩුම තේ ප්‍රමාණය මෙම වර්ෂය තුළ මාවරල කම්හලේ නිෂ්පාදනය කර ඇති අතර, එම ප්‍රමාණය කම්හලේ ධාරිතාවයෙන් 8.33% වැනි ඉතා පහළ අගයක් වේ. වර්ෂය තුළ කිසිදු කම්හලක් පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වී නොමැති අතර, බහුතර කම්හල් 50% ටත් අඩු ධාරිතාවයෙන් ක්‍රියාත්මක වී ඇති අතර, එය කම්හල් ව්‍යාපෘතිය අලාභ තත්ත්වයට පත්වීමට ප්‍රධාන සාධකය වී ඇත.

මෙම වසර පහක කාලය තුළ නිෂ්පාදනය කරන ලද වැඩිම නිමි තේ ප්‍රමාණය වන කි. ග්‍රෑ. 458,806 ක ප්‍රමාණය මහවැලි තේ ශක්ති තේ කර්මාන්තශාලාවෙන් 2011 වසරේදී වාර්තා වූ අතර, අඩුම නිමි තේ ප්‍රමාණය වන කි. ග්‍රෑ. 40,599 ක ප්‍රමාණය 2012 වසරේදී මාස තුනක කාලයක් තුළ දැරණියගල තේ ශක්ති තේ කර්මාන්තශාලාවෙන් වාර්තා විය.

සමස්ථ දළු මිලදී ගැනීම සහ නිමි තේ (කි. ග්‍රෑ.) 2010 සිට 2014 දක්වා



ඉහත දක්වා ඇති ප්‍රස්ථාරය අනුව වාර්ෂිකව දළු මිලදී ගැනීම පහළ යෑමත් එයට සමගාමීව නිමි තේ නිෂ්පාදන ප්‍රමාණය පහළ යාමත් නිරූපනය වේ. නිමි තේ නිෂ්පාදන ප්‍රතිශතය ද සම්මත අගයට වඩා අඩු අගයක පවත්වා ගෙන ගොස් ඇති බැව් නිරීක්ෂණය වන අතර, අලාභ තත්ත්වය ඉහළ යාමට මෙම තත්ත්වය ද එක් සාධකයක් වී ඇත.

2010 සිට 2014 දක්වා වසර පහක කාලය සංසන්දනය කර බැලීමේදී 2014 වර්ෂය දුර්වලම වර්ෂය ලෙස දැක්විය හැකිය. සමස්ථ දළු මිලදී ගැනීමේ ප්‍රමාණය කි.ග්‍රෑ. 8,084,257ක් වූ අතර, නිමි තේ ප්‍රමාණය කි.ග්‍රෑ. 1,697,683 ක් විය.

මෙම තත්ත්වය පරීක්ෂා කර බැලීමේදී දුර්වල අධීක්ෂණ ක්‍රම, අඩු ගුණත්වයෙන් යුතු අමු දළු, දුර්වල යන්ත්‍රෝපකරණ, අයහපත් සබඳතා, නිමි තේවලට ඇති අඩු මිල, නිෂ්පාදනයට අදාළ අනුපාතයන් සීමාව තුළ තබා ගැනීමට නොහැකි වීම (කම්කරු, ශුද්ධ විකුණුම් සාමාන්‍ය) , පොහොර අලෙවිය අඩු වීම (දුර්වල විකුණුම් යාන්ත්‍රණය) මෙම ගැටළුවට මූලික හේතු වේ.

2014 වර්ෂයේ දළු මිලදී ගැනීම සහ නිමි තේ කර්මාන්තශාලා වශයෙන් (කි. ග්‍ර)



9.2.2. කර්මාන්තශාලා ව්‍යාපෘතියේ ලාභදායිත්වය.

අංකය	කර්මාන්තශාලාවේ නම	G/L-KG.	M/T-KG.	OUTTURN %	NSA-RS.	COP-RS.	P/L-Per-KG.	P/L-RS.	P/L-MN.
1	දෙනියාය	713,628	146,651	20.55	441.97	527.22	(85.25)	**(12,501,997.75)**	(12.50)
2	ඇල්පිටිය	497,958	102,435	20.57	433.64	565.26	(131.62)	**(13,482,494.70)**	(13.48)
3	කැප්පෙට්පොල	965,544	206,235	21.36	358.92	391.10	(32.18)	**(6,636,642.30)**	(6.64)
4	කොත්මලේ	389,658	80,351.5	20.62	354.11	488.36	(134.25)	**(10,787,188.88)**	(10.79)
5	මහවැලි	856,455	188,065	21.96	370.71	428.92	(58.21)	**(10,947,263.65)**	(10.95)
6	මාවරල	267,805	55,380	20.68	441.97	644.51	(202.54)	**(11,216,665.20)**	(11.22)
	මාවරල වත්ත							**2,650,181.08**	2.65
7	පස්සර	948,561	209,097	22.04	372.27	382.53	(10.26)	**(2,145,335.22)**	(2.14)
8	රයිගම්කෝරලේ	1,538,794	316,688	20.58	431.25	483.02	(51.77)	**(16,394,937.76)**	(16.39)
9	වලහන්දුව	683,708	141,814	20.74	436.95	537.70	(100.75)	**(14,287,760.50)**	(14.29)
10	දැරණියගල	1,222,146	250,966.5	20.53	382.07	474.62	(92.55)	**(23,226,949.58)**	(23.23)
එකතුව		**8,084,257**	**1,697,683**	**21.00**	**399.47**	**471.11**	**(71.64)**	**(118,977,054.46)**	**(118.98)**

සමාලෝචිත වර්ෂය තුළ ඉහත තේ ශක්ති කර්මාන්තශාලා අතරින් එනම් දෙනියාය (12.5), ඇල්පිටිය (13.4), කැප්පෙට්පොල (6.6), කොත්මලේ (10.7), මහවැලි (10.9), මාවරල (11.2), පස්සර (2.1), රයිගම්කෝරලේ (16.3), වලහන්දුව (14.2) සහ දැරණියගල (23.2) මාවරල වත්ත හැර 2.6 අනෙකුත් කර්මාන්තශාලා රුපියල් මිලියන 118.98 ක අලාභයක් 2014 වසරේ වාර්තා කර ඇත.

2014 වර්ෂයේදී තේ කර්මාන්තශාලා දහයෙන් රයිගම්කෝරලේ තේ ශක්ති තේ කර්මාන්තශාලාව වැඩිම දළු ගැනුම් ප්‍රමාණය වන කි.ග්‍රෑ. 1,538,794 වාර්තා කළ අතර, වැඩිම නිමි තේ ප්‍රමාණය වන කි. ග්‍රෑ. 316,688 වාර්තා කර තිබේ. එහෙත් රයිගම්කෝරලේ තේ ශක්ති තේ කර්මාන්තශාලාවට ශුද්ධ අලෙවි සාමාන්‍ය සහ නිෂ්පාදන වියදම සාර්ථකව පවත්වා ගත නොහැකි වූ නිසා නිමි තේ එක් කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 51.77ක අලාභයක් වාර්තා කර තිබේ

9.2.3. නිෂ්පාදන වියදම සහ ශුද්ධ අලෙවි සාමාන්‍ය (NSA)

තේ ශක්ති කර්මාන්තශාලා 100% ක්ම කුඩා තේ වතු හිමියන්ගෙන් ලබා ගන්නා අමු තේ දළු මත යැපෙන බැවින්, කුඩා තේ වතු අංශයේ දළු මිලදී ගැනීම තේ ශක්ති තේ කර්මාන්තශාලාවේ මෙහෙයුම්වලට ඍජුවම බලපායි.

ශුද්ධ අලෙවි සාමාන්‍ය සහ නිෂ්පාදන වියදම - (රු.) 2010 සිට 2014 දක්වා



අතිරේක ශ්‍රමය, වෙන්දේසිවලින් නිමි තේ සඳහා අඩු මිලක් ලැබීම, අනවශ්‍ය වියදම්, ගාස්තු නියමිත සීමාව තුළ තබා ගැනීමට නොහැකි වීම, දළු සඳහා අමතර ගෙවීම් සිදු කිරීම, අඩු ඵලදායිතාවෙන් යුතු සහායක කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම, අතිකාල දීමනා ඉහළ යාම, ප්‍රවාහන වියදම යන කරුණු ඉහළ නිෂ්පාදන වියදමට සහ පහළ වැටුණු ශුද්ධ අලෙවි සාමාන්‍යට හේතු වේ.

9.2.4. කර්මාන්තශාලාවල ලාභ/අලාභ තත්ත්වය



ප්‍රවර්තන වර්ෂයේ දැරණියගල කම්හල ඉහළම අලාභ තත්ත්වයක් එනම් රු. මිලියන 23.23 ලබා ඇති අතර, පස්සර කම්හල රු. මිලියන 2.14 ක අඩු අලාභ තත්ත්වයක් ලබා ඇත. මාවරල වත්ත රු. මිලියන 2.65 ක ලාභයක් ලබා ඇති බව පෙන්වා ඇතත් එහි අමු දළු සැපයීම පමණක් සිදු කරනු ලැබේ.

තේ ශක්ති කර්මාන්තශාලා සඳහා සමස්තයක් ලෙස අමු දළු මිලදී ගැනීම දුර්වල වීම මත එම කම්හල්වල නිමි තේ නිෂ්පාදනය ද අඩු වී ඇත. මෙම තත්ත්වය ද කම්හල් අලාභදායී තත්ත්වයට පත්වීමට හේතු වී ඇත.

තේ ශක්ති කර්මාන්තශාලා මෙම තත්ත්වයෙන් මුදවා ගෙන ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට නම් කළමනාකාරීත්වය විසින් කර්මාන්තශාලා කළමනාකරුවන්ට, කාර්ය මණ්ඩලයට, නිෂ්පාදන ක්‍රමවලට, යන්ත්‍ර සූත්‍රවලට සහ කුඩා තේ වතු හිමියන්ගේ දළු දායකත්වය ආදියට වැඩි අවධානයක් දැක්විය යුතුය. මෙම කෙටි කාලය තුළ යන්ත්‍රසූත්‍ර සහ අනෙකුත් තාක්ෂණික ක්ෂේත්‍ර වැඩි දියුණු කිරීම සඳහා කර්මාන්තශාලා ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීම ද අවශ්‍ය වේ.

9.2.5. ඇස්තමේන්තුගත තේ දළු ප්‍රමාණය සහ ලැබුණු තේ දළු ප්‍රමාණය - **2010** සිට **2014**

වර්ෂය	ඇස්තමේන්තුගත තේ දළු ප්‍රමාණය කි. ග්‍රෑ.	ලබා ගත් තේ දළු ප්‍රමාණය කි. ග්‍රෑ.	ලබා ගත් තේ දළු ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස
2010	19,398,300	13,064,086	67.35%
2011	18,465,151	12,975,566	70.27%
2012	12,904,700	9,525,540	73.81%
2013	16,807,900	10,118,528	60.20%
2014	15,478,000	8,084,257	52.23%

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ පහ සඳහා වාර්ෂික පදනමින් සන්සන්දනාත්මකව තේ දළු මිලදී ගැනීම ගත් විට වැඩිම මිලදී ගැනීම වාර්තා වන්නේ 2010 වසරේදීය. එය කි. ග්‍රෑ. 13,064,086 ක් වන අතර, එය ඇස්තමේන්තුගත දළු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 67.35% ක් වේ. අඩුම තේ දළු ගැණුම් ප්‍රමාණය ලෙස 2014 වර්ෂයේදී කි. ග්‍රෑ. 8,084,257 ක් වූ අතර, එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 52.23% ලෙස වාර්තා විය.

අයවැය ඉලක්ක ළඟා කර ගැනීමේ වගකීම කළමනාකරුවන් සතු වුවද ක්ෂේත්‍ර මට්ටමේ කාර්යසාධනය ඇගයීම සහ ක්‍රියාකාරකම් නිසි පරිදි පෙළ ගස්වා නොතිබීම නිසා අයවැයෙන් අපේක්ෂිත කාර්ය සාධනයෙන් වෙනස් වීම කළමනාකරීත්වය තුළින් සිදු වී ඇත.

9.2.6. මිලදී ගත් දළු සඳහා සමස්ථ වියදම, සාමාන්‍ය ගාස්තුවලට මිලදී ගත් දළු සඳහා වන වියදම සහ අමතර ගාස්තු ගෙවා මිලදී ගත් දළු සඳහා වන වියදම

වසර	සමස්ත දළු මිලදී ගැනීම් වියදම රු.	අමතර ගාස්තු දළු වියදම රු.	සාමාන්‍ය දළු වියදම රු.
2010	691,289,590	17,736,070	673,553,521
2011	650,283,893	6,027,487	644,256,406
2012	519,092,972	5,918,867	513,174,105
2013	633,024,984	16,282,876	616,742,108
2014	526,129,770	20,809,981	505,319,789

මිලදී ගන්නා දළු සඳහා ගෙවනු ලබන මිල තීරණය කරනු ලබන්නේ නිමි තේ වෙනුවෙන් වෙන්දේසියේදී නියම කරනු ලබන මිලය. කර්මාන්තශාලාවලට හොඳ වර්ගයේ නිමි තේ නිපදවීමට හැකි නම් වෙන්දේසියේදී එම නිමි තේ හොඳම තේ වශයෙන් වාර්තා වන අතර, ගුණාත්මක තත්ත්වයෙන් පහළ නිමි තේ වෙන්දේසියේදී අඩු මිලකට තීරණය වේ.

ලබා දී ඇති තොරතුරුවලින් ඉතා පැහැදිලිව පෙනෙන කරුණ වන්නේ අමතර ගාස්තු ගෙවීම අසාර්ථක කාර්යයක් බවය (දුර්වල ජයග්‍රහණ ගාස්තු%) අමතර ගාස්තු ගෙවීමට පෙර අඩු ගාස්තු, ගුණාත්මක බවෙන් අඩු දළු සහ කුඩා තේ වතු හිමියන්ගේ අවබෝධය (B-60 වැඩසටහන), යන්ත්‍රසූත්‍රවල තත්ත්වය, කම්කරුවන්ට සහ කාර්ය මණ්ඩලයට පුහුණුව සහ වියදම් සාධකය යන කරුණු සම්බන්ධයෙන් සමීක්ෂණයක් කළ යුතුය. එවිට කළමනාකාරීත්වයට දුර්වල ක්ෂේත්‍ර සහ සංවර්ධනය කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීමට අවස්ථාවක් ලැබෙනු ඇත.

9.3. තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය

තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය හොරණ, අරමණාගොල්ල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන අතර, එහි තේ, රබර් සහ කුරුඳු වැනි භෝග සඳහා අවශ්‍ය වන පොහොර අලෙවි කරනු ලැබේ මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව, යටතේ කුඩා තේ වතු හිමියන් සඳහා වන පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමඟ විශාල ප්‍රමාණයක පොහොර අලෙවියක් ලබා ගත හැකි විය.

2014 වර්ෂය තුළ තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය මඟින් රු. 31,277,680 ක පොහොර අලෙවි ආදායමක් ලබාගෙන ඇත. ඉහළ අලෙවි ආදායම මෙම වසරේදී වාර්තා වූ අතර, මෙම වසර පසුගිය වසර සමඟ සැසඳීමේදී පොහොර අලෙවි ආදායම රු. 1,112,597.50 කින් වැඩි වී ඇත.

පොහොර අලෙවිය සහ ආදායම - 2010 සිට 2014 දක්වා

කාණ්ඩය	2010	2011	2012	2013	2014	එකතුව
ප්‍රමාණය (මෙ.ටො.)	2,164.32	2,065	909.80	1,340	1,440.01	**7,919.**13
ආදායම (රු.)	124,113,556.34	70,710,918.49	18,158,986.25	30,165,082.5	30,880,997	**274,029,540.58**

රජයේ පොහොර සහනාධාර ව්‍යාපෘතිය යටතේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නිර්දේශිත යෙදවුම් 2006 වසරේ සිට ආරම්භ වූ අතර, 2013 සමඟ සංසන්දනය කිරීමේදී වැඩිම අලෙවියක් සහිත වර්ෂය ලෙස 2014 දැක්විය හැකිය.

තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය මඟින් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ සමස්තයක් ලෙස පොහොර මෙ. ටො. 7,919.13 ක් අලෙවි කර ඇති අතර, එහි අලෙවි ආදායම රු. 274,029,540.58 ක් වේ. වැඩිම පොහොර අලෙවිය සහ ආදායම ලබාගත් වර්ෂය ලෙස 2010 වර්ෂය දැක්විය හැකි අතර, පොහොර මෙ. ටො. 2,164.32 ක් අලෙවි කර ඇත.

තේ ශක්ති අරමුදල මඟින් අමිශ්‍ර පොහොර ලෙස සල්ෆේට් ඔෆ් ඇමෝනියා (SA), කීසරයිට්, යුරියා, එප්පාවෙල රොක් පොස්ෆේට් (ERP) සහ මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) මිලදී ගන්නා ලදී. එම පොහොර භාවිතා කිරීමෙන් මිශ්‍ර පොහොර ලෙස තේ සඳහා T-200, T-750, U-709, UT-397, U-752, U-625 සහ රබර් පොහොර, කුරුඳු පොහොර, පොල් පොහොර නිශ්පාදනය කර අලෙවි කරන ඇත. මීට අමතරව ඩොලමයිට් සහ සින්ක් සල්ෆේට් අලෙවි කිරීම ද සිදු කර ඇත.

9. 4. තේ ශක්ති දේශීය තේ අලෙවිය

2014 වර්ෂයේ අලෙවි ආදායම 2013 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී සමස්ත තේ අලෙවිය ආදායම රු. 18,259 කින් වැඩි වී ඇත.

දේශීය තේ අලෙවි ආදායම 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා

කාණ්ඩය	2011	2012	2013	2014
දේශීය තේ අලෙවිය (රු)	3,569,103	2,290,100	2,830,159	2,848,418

තේ අලෙවිය වැඩි කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික සුභසාධන ආයතන හරහා කටයුතු කිරීම අවශ්‍ය වේ. පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර රෝහල, ඔරේන්ජ් පුද්ගලික සමාගම ආදී ආයතන විසින් සංවිධානය කරන ලද කුඩා පොළවල්වලට ආරාධනා ලද අතර, දැයට කිරුළ වැඩටසටහන ද අවධානය යොමු කර තිබේ. මනා නිපුණතාවකින් යුත් වෙළෙඳ බලකායක් සහ යාන්ත්‍රණයක් තිබේනම් අලෙවි ප්‍රමාණය සහ ආදායම් මට්ටම තවදුරටත් වැඩි කළ හැකි බව දේශීය තේ අලෙවි අංශයේ කළමනාකරුගේ විශ්වාසය විය.

දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය තනි පාරිභෝගිකයන් වෙත ළඟා වීම සඳහා කර්මාන්තශාලා සහ ප්‍රධාන කාර්යාලය හරහා ක්‍රියාත්මක කිරීම ද සිදු කර ඇත.

ප්‍රමාණවත් අලෙවි යාන්ත්‍රණයක් සහ නිපුණ සේවකයන් දේශීය තේ අලෙවිය සඳහා සිටියි නම් තමන්ගේම නිෂ්පාදන බෙදා හැරීම විශාල වශයෙන් වාසිදායක වන අතර, එමගින් තම කටයුතු ලාභදායී ආකාරයට තිරසාරව සිදු කර ගැනීමට හැකියාව ඇත. තේ ශක්ති අරමුදලේ සංශෝධිත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලැබුණු වහාම මේ සම්බන්ධව කටයුතු සිදු කිරීමට පියවර ගැනීමට අපේක්ෂිතය.

9. 5. තේ ශක්ති සමාජ සහ සුභසාධන ආරක්ෂණ ක්‍රමය

මෙම සුභසාධන රක්ෂණ අරමුදල කුඩා තේ වතු හිමියන් සඳහා ඇති එකම සුභසාධන ව්‍යාපෘතිය වේ. එක් සාමාජිකයෙක් යාවජීව සාමාජිකත්වය ලබා ගැනීම සඳහා රු. 2,400 ක් ගෙවිය යුතුය.

ව්‍යාපාර සමාජය තුළ 'ප්‍රජා සමාජ වගකීම්' යනුවෙන් හඳුන්වන තේ ශක්ති අරමුදල යටතේ පවතින වැදගත් අංශයක් ලෙස මෙය හැඳින්විය හැකිය. බංගලාදේශය සහ වියට්නාමය හැරුණු කොට මෙම ව්‍යාපෘතිය පවතින එකම සුභසාධන ව්‍යාපාරය මෙය වේ.

සුභසාධන ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා

වසර	සාමාජික සංඛ්‍යාව	රක්ෂණ පාරිතෝෂිකය	ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව	ප්‍රතිලාභ වටිනාකම රු.
2010	96,000	14,737,379.96	557	10,705,000.00
2011	96,000	14,125,000.00	839	15,655,776.00
2012	97,000	13,661,120.00	745	16,177,732.00
2013	97,000	-	669	13,618,631.04
2014	93,574	9,834,830.88	505	9,471,548.00

පසුගිය වසර පහ තුළ මෙම සුභසාධන ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉහත දැක්වේ. ඒ අනුව, වැඩිම සාමාජික සංඛ්‍යාවක් වන 97,000 දෙදෙනකු 2012 වර්ෂයේ දී හා 2013 වර්ෂයේදී වාර්තා වී ඇත. 2014 වර්ෂයේදී එම සමාජික සංඛ්‍යාවේ අඩු වීමක් දක්නට ලැබෙන අතර, එය 93,574 ලෙස ඉහත වගුවේ දක්වා ඇත.

2014 වර්ෂයේදී සාමාජිකයින් සඳහා ගෙවන ලද රක්ෂණ පාරිතෝෂිකයෙහි අඩු වීමක් පෙන්වයි. 2013 වසරේදී ප්‍රතිලාභ ගෙවීම් කඩිනම් කිරීමට සහ රක්ෂණ සමාගම් මඟින් සිදු වන අක්‍රමිකතා මහහරවා ගැනීමට හැකි වීම යන කරුණු අනුව 2012.11.28 දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී ගත් තීරණය මත තේ ශක්ති අරමුදල මඟින් සෘජුවම ප්‍රතිලාභ ගෙවීම සිදු කරන ලදී.

ප්‍රතිලාභ හිමියන්ගේ සංඛ්‍යාව සාමාන්‍ය මට්ටමකින් පවත්වාගෙන ගිය අතර, 2011 වසරේ වැඩිම ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් 839 වාර්තා වී තිබේ. 2014 වර්ෂයේ ගෙවන ලද ප්‍රතිලාභවල වටිනාකම රු. 9,471,548 ක් වන අතර, එය 2013 වසරට සාපේක්ෂව රු. 4,147,083.04 ක අඩු වීමක් ලෙස දැක්විය හැක.

9.6. කුඩා තේ වතු හිමියන්ගේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

රක්ෂණ සුභසාධන යෝජනා ක්‍රමයේ සාමාජිකයන් සහ වෙනත් විශ්‍රාමවැටුප් ප්‍රතිලාභ සැලසුමක අන්තර්ගත නොවන වයස 18 – 60 අතර කුඩා තේ වතු හිමියන් හට මෙම කුඩා තේ වතු හිමියන්ගේ විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයන් විය හැකිය. ඔවුන්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට ඔවුන් විසින් විශ්‍රාම වැටුප් අරමුදලට දක්වන ලද දායකත්වය අනුව මාසික විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබේ.

9.7. කොටස්කරුවන්/ සමකොටස්

	(රු.)
1. ශ්‍රී ලංකා රජය	**437,505,030.22**
11. කුඩා තේ වතු හිමියන්	
අ. කොටස්කරුවන් (පාර්ශවකරුවන්)	**208, 959,130.00**
ආ. තේ ශක්ති සාමාජිකයන්	**133, 465,892.58**

කොටසක මූලික ආදායම 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා

වර්ෂය	කොටසක මූලික ඉපයීම (රු.)
2011	(4.10)
2012	3.93
2013	(2.88)
2014	(6.20)

<u>තේ ශක්ති කොටස් නිකුතුව පිළිබඳ විස්තර</u>

මිලදී ගත් කොටස් ගණන	මිලදී ගත් කොටස් හිමියන්
1 - 24	19,780
25 - 50	18,341
51 - 100	19,875
101 - 200	16,682
201 - 300	6,006
301 - 400	1,242
401 - 500	3,783
501 - 1,000	3,984
1001 - 2,000	1,834
2001 - 3,000	774
3,001 - 4,000	100
4,001 - 5,000	475
5,001 - 10,000	333
10,001 <	4
මුළු එකතුව	**94,425**

2002 වර්ෂයේදී තේ ශක්ති කොටස් නිකුතුව ආරම්භ කළ අතර, එමඟින් රු. 10/- වටිනාකමකින් යුතු කොටස් නිකුත් කරන ලදී. කොටස් 20,900,000 ක් තේ ශක්ති සාමාජිකයින් 94,425 කට නිකුත් කරමින් රු. 209,000,000/- උපයා එම මුදල තේ ශක්ති අරමුදල ස්ථාපනය කිරීම සඳහා යොදවා ඇත.

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ විස්තීරන ආදායම් ප්‍රකාශනය	සටහන	2014	2013
ආදායම්	6	621,589,674	773,033,440
විකුණුම් පිරිවැය		(611,323,143)	(702,639,456)
දල ලාභය		**10,266,531**	**70,393,984**
වෙනත් ආදායම්	7	44,085,060	44,692,274
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්		(15,508,944)	(17,870,755)
පරිපාලන වියදම්		(200,329,899)	(195,661,407)
මෙහෙයුම් ලාභය		**(161,487,253)**	**(98,445,904)**
පොලී ආදායම්	8	6,617,864	8,758,135
පොලී වියදම්	8	(16,704,848)	(13,428,522)
රාජ්‍ය පරිත්‍යාග කපා හැරීම		43,750,503	43,750,503
බදු පෙර ලාභය / අලාභය	9	**(127,823,734)**	**(59,365,788)**
ආදායම් බදු වියදම්	10		
වසරේ ලාභය / අලාභය		**(127,823,734)**	**(59,365,788)**
කොටසක මූලික ඉපයීම (රු.)	11	**-6.2**	**-2.88**
වසරේ ලාභය / (අලාභය)		(127,823,734)	(59,365,788)
වෙනත් විස්තීර්ණ ආදායම			
දේපල, පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණන අතිරික්තය			
වසරේ විස්තීරණ ආදායම් වල (ලාභ / අලාභ) එකතුව		**(127,823,734)**	**(59,365,788)**

දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය	සටහන	2014	2013
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**12**	330,775,955	358,571,676
අපෘෂ්ඨ වත්කම්	**13**	2,435,000	2,435,000
ආයෝජන වත්කම්	**14**	16,014,636	17,601,061
මේරූ / නොමේරූ වගා	**15**	13,427,908	11,816,506
ස්ථාවර / කාලීන තැන්පතු ආයෝජන		8,411,979	60,927,063
ජංගම නොවන වත්කම් එකතුව		**371,065,478**	**451,351,306**
ජංගම වත්කම්			
තොග	**17**	114,050,930	155,454,523
වෙළඳ ණයගැතියෝ හා වෙනත් ලැබිය යුතු දෑ	**18**	263,052,111	261,237,796
නිත්‍යානුකූල ලැබිය යුතු දෑ	**19**	3,415,813	3,806,028
වෙනත් මූල්‍ය වත්කම්			-
මුදල් හා මුදල්වලට සමාන දෑ	**20**	6,891,350	10,607,999
ජංගම වත්කම් එකතුව		**387,410,203**	**431,106,346**
වත්කම් එකතුව		**758,475,681**	**882,457,653**
කොටස් ප්‍රාග්ධනය හා බැරකම්			
සාමාන්‍ය කොටස්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**21**	206,014,150	206,014,150
ප්‍රත්‍යාගණ සංචිතය	**21**	50,249,773	50,249,773
රඳවාගත් ඉපයීම්	**21**	(328,680,172)	(200,856,437)
කොටස් හිමියන්ගේ අයිතිය		**(72,416,249)**	**55,407,486**
ජංගම නොවන බැරකම්			
සාමාජිකයන්ගේ රක්ෂණ සුභසාධන අරමුදල			
සාමාජිකයන්ගේ දායකවීම්	**22**	135,184,750	135,089,150
රජයේ සංක්‍රාම	**23**	331,803,521	350,004,024
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	**24**		
පොලී සහිත ණයගැනීම් - (ජංගම සණයේ නොවන)	**25**	13,455,505	9,574,365
විශ්‍රාම ප්‍රතිලාභ වෙන් කිරීම්	**26**	26,431,382	20,275,222
ජංගම නොවන බැරකම් එකතුව		**506,875,158**	**514,942,761**
ජංගම බැරකම්			
වෙළඳ ණයහිමියෝ හා වෙනත් ගෙවිය යුතු දෑ	**27**	315,491,677	257,614,853
පොලී සහිත ණය ගැනීම් - (ජංගම ගණයේ)	**25**	4,925,892	3,881,140
නිත්‍යානුකූල ගෙවීමට ඇති දෑ	**28**	3,599,202	2,203,302
බැංකු අයිරා	**20**		48,408,111
ජංගම බැරකම් එකතුව		**324,016,772**	**312,107,406**
කොටස් හිමියන්ගේ අයිතිය හා බැරකම් එකතුව		**758,475,681**	**882,457,653**

අරමුදලෙහි මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්ථාකරණ ප්‍රමිති ප්‍රකාරව සකස් කර ඇති බවට සහතික කරමි.

අත්සන් කළේ

දේශබන්දු විජේරත්න දෙවගෙදර	නෙවිල් රත්නායක	පී.ජී.ආර්. කිස්ස
සභාපති	ප්‍රධාන විධායක නිලධාරී (වැඩබලන)	ප්‍රධාන ගණකාධිකාරී
තේ ශක්ති අරමුදල	තේ ශක්ති අරමුදල	තේ ශක්ති අරමුදල

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂයේ සමකොටස් වෙනස්වීමේ ප්‍රකාශනය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	පිළිඇගයුම් සංචිතය	රඳවාගත් ඉපයීම්	එකතුව
2013 දෙසැම්බර් 31 දිනට ශේෂය	206,014,150	50,249,773	(200,856,438)	**55,407,485**
වසරේ ලාභය			(127,823,734)	
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	**206,014,150**	**50,249,773**	**(328,680,172)**	**(72,416,249)**

වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අවකරන දැක්වේ.

පිටු අංක **5** සිට **29** දක්වා වන මූල්‍ය ප්‍රකාශනවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ කොටසකි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මුදල් ගලන ප්‍රකාශනය		2014	2013
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහ			
බදු පෙර ලාභය		(127,823,734)	(59,365,788)
ගැලපුම් කිරීම්			
ක්ෂය වෙන් කිරීම්		32,134,270	32,250,893
රාජ්‍ය ප්‍රදාන ලියා හැරීම		(43,750,503)	(43,750,503)
මේරූ වගාවන්වල ලියා හැරීම		592,250	343,349
දේපල, පිරියත හා උපකරණවල (වාසි)/පාඩුව			
ප්‍රාග්ධන සංක්‍රාම ලියා හැරීම			(2,944,980)
පාරිතෝෂික ප්‍රතිපාදන		9,418,925	3,101,401
පොලී ආදායම		(6,617,864)	(8,758,135)
පොලී වියදම්		16,704,848	13,428,522
මෙහෙයුම් ලාභය - කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම් වලට පෙර		**(65,695,241)**	**(65,695,241)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්			
තොග		41,403,594	5,991,943
වෙළඳ ණය ගැතියෝ සහ වෙනත් ලැබීමට නියමිත දෑ		(1,814,314)	(19,790,003)
ව්‍යාවස්ථාපිත ලැබීම්		390,215	2,258,540
වෙළඳ ණයහිමියෝ සහ වෙනත් ගෙවිය යුතු දෑ		57,876,825	52,508,737
ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ		1,395,901	68,346
මෙහෙයුම්වලින් ඉපයූ මුදල		**(20,089,588)**	**(24,657,678)**
ගෙවූ පාරිතෝෂික		(3,262,765)	(3,195,001)
ගෙවූ පොලී මුදල්		(16,704,848)	(13,428,522)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය		**(40,057,202)**	**(41,281,201)**
ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය			
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම		(1,056,447)	(2,025,368)
නොනිමි ප්‍රාග්ධන කාර්යය		(1,695,678)	(695,761)
නොමේරූ වගාවන් මිලදී ගැනීම		(2,203,652)	(2,303,600)
ස්ථිර තැන්පත් හා වෙනත් මූල්‍ය වත්කම් කල් පිරීමෙන් ලත් මුදල		52,515,085	22,518,670
වසරේ රාජ්‍ය සංක්‍රාම ලැබීම්		25,550,000	
ලත් පොලිය		6,617,864	8,758,135
ආයෝජන ක්‍රියාකාරකම් වලට භාවිතා කළ ශුද්ධ මුදල		**79,727,172**	**26,252,076**
මූල්‍ය ක්‍රියාකාරම් වල මුදල් ප්‍රවාහය			
සාමාජිකයන්ගේ දායකත්ව		95,600	87,725
ලබාගත් කාලීන ණය		16,332,302	1,443,000
ණය පියවීම		(11,406,410)	(5,324,140)
මූල්‍ය ක්‍රියාකාරම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		**5,021,492**	**(3,793,415)**
මුදල් හා මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වෙනස්කම් - වසර තුලදී		**44,691,462**	**(18,822,541)**
			(6,340,168)
මුදල් හා මුදල් වලට සමාන දෑ - වසරාරම්භයේ		(37,800,112)	(12,637,403)
මුදල් හා මුදල් වලට සමාන දෑ - වසරාවසාන	**(20 සටහන)**	**6,891,350**	**(37,800,112)**

වරහන් තුල ඇති සංඛ්‍යා මඟින් අවකරන දැක්වේ.

පිටු අංක **5** සිට **29** දක්වා වන මූල්‍ය ප්‍රකාශනවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ කොටසකි.

තේ ශක්ති අරමුදල
2014 දෙසැම්බර් 31වනදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.2 පොදුකරුණු

මින් මතුවට ''තේ ශක්ති අරමුදල'' ලෙස හඳුන්වනු ලබන 2000 අංක 47 දරණ පාර්ලිමේන්තු පනත යටතේශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකාවේ ස්ථාපිත අරමුදලකි. එහි ලියාපදිංචි කාර්යාලය අංක 70, පාර්ලිමේන්තුව පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටා ඇත. මෙම අරමුදලේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ තරඟකාරී වෙළඳපල තුළ ගුණාත්මක තේ නිෂ්පාදනය මගින් කුඩා තේ වතු හිමියන්ට සාධාරණ මිලකට යෙදවුම් ලබාදීම තුළින් ඔවුන් විසින් නිපදවන තේ දළු සඳහා හොඳ මිලක් ලබා දීම හරහා ඔවුන්ගේ ආර්ථික සහ සමාජ තත්ත්වය නගා සිටුවීමයි. මෙම අරමුදලේ ව්‍යාපාරික ස්ථාන හොරණ, මාතර, ගාල්ල, බදුල්ල, නුවර, නුවරඑළිය සහ මාතලේ යන දිස්ත්‍රික්කවල පිහිටුවා ඇත.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

අරමුදලේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ තේ සහ පොහොර නිෂ්පාදනයකිරීම හා අලෙවි කිරීමයි.

1.4 සේවක සංඛ්‍යාව

වර්ෂයඅවසානය වන විට මෙම අරමුදලේ ස්ථිර සේවකයින් සංඛ්‍යාව 558 ක් විය.

1.5 නිකුත් කිරීම සඳහා අවසර දෙන ලද දිනය

2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2016.05.09 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල යෝජනාවක් අනුව බලය පවරන ලදි.

2. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

තේ ශක්ති අරමුදලේ (''අරමුදල'') මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකසා ඇත. ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ මූල්‍ය ප්‍රකාශ සකසා ඇති අතර දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය සාධාරණ වටිනාකම මගින් නව්‍යකරණය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සැකසීම සඳහා අත්‍යාවශ්‍ය ගිණුම් භාවිත කිරීම අවශ්‍ය කෙරේ. ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කිරීමේ ක්‍රියාදාමය තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය කටයුතු කළ යුතුවේ. ඉහළ තලයේ මැදිහත්වීමක් හෝ පෙළඹවීමක් අවශ්‍ය කරන අංශ හෝ මූල්‍ය ප්‍රකාශවලට වැදගත් වන ඇස්තමේන්තු හා උපකල්පිත අවශ්‍ය අංශ සටහන් අංක 4හි දක්වා ඇත.

අරමුදල 2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වාර්තාකරණ කාල සීමාව ඇතුළුව පෙර කාල සීමාවන් සඳහා වූ තම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකසා ඇති අතර ඒවා 2011 දෙසැම්බර් 31 දිනදක්වා අදාල වේ. මෙම මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 1 ප්‍රථම වරට සම්මත කර ගැනීම අනුව සකස් කරන ලද පළමු ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිමූල්‍ය ප්‍රකාශ වේ. පෙර වාර්තා කරන ලද අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය කෙරෙහි ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට මාරුවිමේ බලපෑම මූල්‍ය ප්‍රකාශවලසටහන් අංක 33හි දක්වා ඇත.

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විවිධ්‍යයන් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශවල කාලසීමාවන්ට අදාළව අඛණ්ඩව ඉදිරිපත් කර ඇති අතර, අන්‍යාකාරයකින් සඳහන් කර නොමැත්තේ නම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට මාරු වූ දිනයේ මූල්‍ය තත්ත්වය ආරම්භක ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුව සකසා ඇත.

පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම මනාව ඉදිරිපත් කිරීම සඳහා අදාළ වන පරිදි, ප්‍රවර්තන වර්ෂයට ගැලපෙන ලෙස සංශෝධනය කර ඇත.

2.3 විදේශීය ව්‍යවහාර මුදල් පරිවර්තනය

(අ)ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් ගණුදෙනු සහ ශේෂයන් මනිනු ලබන්නේ, ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල භාවිත කිරීමෙනි. අරමුදල් ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

(ආ) ගණුදෙනු හා ශේෂ

විදේශීය මුදල් ගණුදෙනු ක්‍රියාත්මක මුදල් බවට ගණුදෙනු සිදු කරන දිනය වනවිට පැවතෙන විනිමය අනුපාත භාවිත කර පරිවර්තනය කර ඇත. එවැනි ගණුදෙනු පියවීම නිසා ඇති වන විදේශීය විනිමය වාසි හා පාඩු සහ විදේශීය මුදල් තුළ අඩංගු මූල්‍ය වත්කම් හා බැරකම්වල වසර අවසාන විනිමය අනුපාත පරිවර්තනය මගින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

ක්‍රමක්ෂය කළ පිරිවැයවල විචල්‍යයන්ට අදාළ පරිවර්තන වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

2.4 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ වත්කම් පිහිටි ස්ථානය වෙත ගෙනයාමට සෘජුව දායක වූ කිසියම් හෝ පිරිවැය ද හා කළමනාකාරිත්වය මඟින් අදහස් කරන ලද ආකාරයට ක්‍රියාවට නංවාලී මට ඇති හැකියාවට අදාළ කොන්දේසි ඇතුළුව පිරිවැය අගය අනුව මූලිකව හඳුනා ගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ වටිනාකම අනුව 2011 දෙසැම්බර් 31 දිනට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සැකසූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දක්වා ඇත. දේපල, පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණනය කළ වටිනාකම කල්පිත පිරිවැයක් ලෙස ප්‍රත්‍යාගණනය කළ දිනට සාධාරණ අගයට වඩාත් පුළුල් ලෙස සන්සන්දනාත්මකව සැලකීමට අරමුදල තීරණය කර ඇත. කල්පිත පිරිවැය, දේපල, පිරියත හා උපකරණ ලෙස සැලකීමෙන් පසුකාලීනව පිරිවැය රහිත සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි පාඩු ගණනය කෙරේ.

පසුකාලීන පිරිවැය වත්කම් ධාරණ අගයට ඇතුළත් කර හෝ වත්කමක් ලෙස හඳුනා ගෙන ඇත. ඒ අනුව, අයිතමයක් හා බැඳුනු ඉදිරි ආර්ථික වාසි අත්වන අවස්ථාවක පමණක් ඒවා අරමුදලට එකතු විමටත් ඒ අනුව අයිතමයක් පිරිවැය විශ්වාසිදායකව ගණනය කිරීමට හැකි වනු ඇත. වෙනත් සියළු පිළිසැකසුම් හා නඩත්තුව ඒවා සිදු කළ මූල්‍ය කාල සීමාව තුළ දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

ඉඩම ක්ෂය කිරීමක් සිදුනොකරන අතර, පහත දැක්වෙන පරිදිඅනෙකුත් වත්කම් ක්ෂයවීම්, ඒවායෙහි ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය මත ඒවායේ පිරිවැය වෙන් කිරීම සඳහා සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලැබේ.

වත්කම් කාණ්ඩය	ප්‍රත්‍යාගණන දිනට අපේක්ෂිත ඵලදායී ආයු කාලය
ගොඩනැගිලි	වර්ෂ40
පිරියත හා යන්ත්‍රෝපකරණ	වර්ෂ13
ලී බඩු සහසවිකුරු	වර්ෂ10
මෝටර් රථ	වර්ෂ10
පරිනත වගාව - තේ	වර්ෂ33

වත්කමක ධාරණ අගය එහි අපේක්ෂිත ආපසු අය කරගත හැකි මුදලට වඩා වත්කමක ධාරණ වටිනාකම වැඩිවන අවස්ථාවක එය අය කර ගත හැකි මුදලක් ලෙස ක්ෂණිකව ලියා තබනු ලබයි.

2.5 අස්පෘෂ්‍ය වත්කම්

මිලදී ගත්පරිගණක මෘදුකාංග විශේෂිත මෘදුකාංග හා පද්ධති භාවිතයට ගැනීම සඳහා හා මිලදී ගැනීමට සිදු කළ පිරිවැය මත පදනම්ව ප්‍රාග්ධනිත කර ඇත. මිලදී ගත් අස්පෘෂ්‍ය වත්කම් ඒවායේ පිරිවැය අගයට දක්වා ඇත. මිලදී ගත් අස්පෘෂ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි පාඩු අඩු කර පිරිවැය අගයට දක්වා ඇත. මෙම පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලය මත පහත පරිදි ක්‍රමක්ෂය කර ඇත.

පරිගණක මාදුකාංගවර්ෂ 5

පරිගණක මෘදුකාංග නඩත්තුවට අදාළ පිරිවැය සිදු කළ වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

ආයෝජනදේපල

ආයෝජන 5දේපල යනු කුලී ආදායම් ඉපයීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ ඒ දෙකටම අයත් දේපල වුවද ඒවා සාමාන්‍ය ව්‍යාපාර ක්‍රමය තුළින් විකිණීම සඳහා වන ඒවා නොවන අතර, භාණ්ඩ නිෂ්පාදනය හෝ සැපයීම සඳහා හෝ පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ.

2011 දෙසැම්බර් 31 ට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සකසා ඇති මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන අගයට ආයෝජන දේපල ඉදිරිපත් කර ඇත. ආයෝජන දේපලවල ප්‍රත්‍යාගණන මුදල කල්පිත පිරිවැයක් ලෙස ප්‍රත්‍යාගණනය කළ දිනට සාධාරණ අගයට වඩාත් පුළුල් ලෙස සන්සන්දනාත්මකව ආයෝජන දේපල සැලකීමට අරමුදල තීරණය කර ඇත.

ගොඩනැගිලිවල ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ පහත දැක්වෙන පරිදි ඒවායේ පිරිවැය හෝ සැලකූ පිරිවැය ප්‍රතිපාදනය කිරීම සඳහා සරල රේඛීය ක්‍රමය භාවිත කරමිනි.

ආයෝජන දේපල වර්ෂ 40

2.6 ජීව විද්‍යාත්මක වත්කම් – පරිනතහාඅපරිනතවගාව

ජීව විද්‍යාත්මක වත්කම්, පරිනතජීව විද්‍යාත්මක වත්කම් හා අපරිනතජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. අස්වැන්න නෙලිය හැකි වර්ග පරිනතජීව විද්‍යාත්මක වත්කම් වේ. පරිනතජීව විද්‍යාත්මක වත්කම් යනු අස්වැන්න ලබා දෙන හෝ නිතිපතා අස්වැන්න අත්කර දෙන ඒවා වේ. අපරිනතජීව විද්‍යාත්මක වත්කම් යනු මෙතෙක් අස්වැන්න ලබා නොදෙන ඒවා වේ. තේ හා දැවමය වගාවන් ජීව විද්‍යාත්මක වත්කම් ගණයට අයත් වේ.

ඉඩම් සැකසීම, නව වගාව හා නැවත වගාව සහ පොහොර යෙදීම සඳහා පැල සිටුවීම හා අස්වැන්න නෙලීම අතර, කාලය තුළ දරන ලද පිරිවැය අපරිනත වගා ලෙස වර්ගීකරණය කර ඇත. මෙම අපරිනත වගාවන් සෘජු පිරිවැය සහ ආරෝපණය කළ හැකි පොදු කාර්ය සඳහා දක්වා ඇත.

ජීව විද්‍යාත්මක වත්කම්, භාරක ජීව විද්‍යාත්මක වත්කම් සහ පාරිභෝග්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස තවදුරටත් වර්ගීකරණය කෙරේ. භාරකජීව විද්‍යාත්මක වත්කම් වලට විකිණීමට හෝ අස්වැන්න නෙලීමට අදහස් නොකරන තේ පැල ඇතුළත් වන අතර, එහෙත්, අස්වනු ලබා දෙන කෘෂිකාර්මික නිෂ්පාදන වගා කිරීම සඳහා යොදා ගැනේ. ජීව විද්‍යාත්මක වත්කම්වලින් කෘෂිකාර්මික නිෂ්පාදන ලෙස අස්වනු නෙළීමට හෝ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස විකිණීමට ඇති දැව වගාව පාරිභෝග්‍ය ජීව විද්‍යාත්මක වත්කම්වලට ඇතුළත් වේ.

වර්ෂය තුළදී ඵල දරනු ලබන භාරකජීව විද්‍යාත්මක වත්කම් සඳහා දරන ලද වියදම් පරිනත වගාවන්ට මාරු කර ඇත. පාරිභෝග්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සඳහා සිදු කළ වියදම් මූලික හඳුනා ගැනීමේ දී වන පිරිවැයක් ලෙස දක්වා ඇත.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය විසින් වත්කම් පාලනය කරන අවස්ථාවකදී පමණක් අරමුදල ජීව විද්‍යාත්මක වත්කම් හඳුනා ගැනීම සිදු කරන අතර, වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමට ඉඩ ඇති විට සහ වත්කම්වල සාධාරණ වටිනාකම හෝ පිරිවැය විශ්වසනීයව මැනිය යුතුය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද රීතියට අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16(LKAS16) - දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාරව, භාරක ජීව විද්‍යාත්මක වත්කම් මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු ඇත්නම්, ඒවා පිරිවැයෙන් අඩු කිරීමෙනි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41(LKAS 41) ප්‍රකාරව දැවමය වගාවන් මූලිකව හඳුනා ගැනීමට හා දක්වා සිටින එක් එක් කාලය අවසානයේ පිරිවැය අඩු කර සාධාරණ අගයට විකිණීමට ගණනය කරනු ලැබේ.

2.7 මූල්‍ය නොවන වත්කම්වල හානි පාඩු

වත්කම්වලට හානි පාඩු සිදුවී ඇත්දැයි නිශ්චය කර ගැනීම සඳහා දක්වා සිටින එක් එක් කාල සීමාව අවසානයේ, අරමුදලේ දේපල, පිරියත, උපකරණ, අස්පෘශ්‍ය වත්කම් හා ආයෝජන දේවල භාරක අගයන් අරමුදල සැලකිල්ලට ලක් කරයි. එවැනි කිසියම් හැඟවීමක් ඇති අවස්ථාවක, හානි පාඩු ප්‍රමාණය දැන ගැනීම සඳහා වත්කමෙහි අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කෙරේ. පුද්ගල වත්කමක අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කිරීමට නොහැකි වන අවස්ථාවක, මුදල් උත්පාදන ඒකකය (CGUs) කුමක්දැයි අරමුදල තීරණය කර වත්කම අයත් මුදල් උත්පාදන ඒකකයේ අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කෙරේ.

අයකර ගත හැකි මුදල යනු සාධාරන වටිනාකම, විකිනීමේ පිරිවැය හා භාවිත කිරීමේ වටිනාකම අඩු කල පසු ලැබෙන අගයයි. ඇස්තමේන්තු ගත ඉදිරි මුදල් ප්‍රවාහවල වටිනාකම තක්සේරු කිරීමේ දී, මුදල්වල කාලීන වටිනාකම්වල වෙළඳපල තක්සේරුව හුවා දක්වන මුදල් ප්‍රවාහ බදු පෙර වට්ටම් අනුපාතයට සත්‍ය වටිනාකමට හා ගැලපුම් කර නැති ඉදිරි මුදල් ප්‍රවාහ සඳහා වන වත්කමට අදාළ අවදානම් වට්ටම් කෙරේ.

වත්කමක ආපසු අයකර ගත හැකි මුදල එහි ධාරණ අගයට වඩා අඩුවෙන් ඇති අවස්ථාවක, වත්කමෙහි ධාරණ අගය එහි ආපසු අය කර ගත හැකි මුදලකට අඩු කෙරේ. හානි පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ක්ෂණිකව හඳුනා ගැනේ.

2.8 මූල්‍යවත්කම්

(අ) වර්ගීකරණය

අරමුදල තම මූල්‍ය වත්කම් වර්ගීකරණය මූලික හඳුනා ගැනීමේ දි තීරණය කරන අතර, පහත දැක්වෙන ආකාරයට මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ.

I. ණය සහ ලැබියයුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු ස්ථීර හෝ නිශ්චය කළ හැකි ගෙවීම්වලින් සමන්විත ව්‍යුත්පන්න නොවන සක්‍රිය වෙළඳපලේ මුදා හැර නැති මූල්‍ය වත්කම් වේ. වාර්තා කරන දිනය අවසානයට පසුව මාස 12 කට වැඩි කල්පිරීමක් වන දෑ හැර ණය හා ලැබියයුතු දෑ සථ්‍ය වත්කම් තුළ අඩංගු වන අතර, ඒවා සථ්‍ය නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. අරමුදලේ ණය හා ලැබියයුතු දෑ අතර, වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ, කාලීන තැන්පත්/ අත්තිකාරම්/ පූර්ව ගෙවීම් හා තැන්පත්වල ආයෝජන සහ වාර්තා කරන කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ ඇතුළත්වේ.

(ආ) හඳුනාගැනීම හා මූලික මිනුම

ණය හා ලැබියයුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති මූල්ය වත්කම් අරමුදල ගණුදෙනුව ආරම්භකළ දිනයේ සිට හඳුනා ගෙන ඇත. වෙනත් මූල්‍ය වත්කම් මූල්‍ය ලේඛණයේ ගිවිසුම් ප්‍රතිපාදනය සඳහා අරමුදල පාර්ශ්වකරුවෙකු බවට පත් වන වෙළඳ දිනයේදී හඳුනාගැනීමට ලක්කරඇත.

මූල්‍ය වත්කම් මූලිකව වශයෙන් ගණුදෙනු පිරිවැයට සාජුවම බලපාන ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමක් ඇති වත්කම්වලදී සාධාරණ වටිනාකම එකතු කර ගණනය කෙරේ.

මූල්‍ය වත්කම් වලින් මුදල් ප්‍රවාහය ලබා ගැනීමට හිමිකම අහෝසි වී ඇති හෝ මාරු කර ඇති අවස්ථාවක මූල්‍ය වත්කම් නොසළකා හැරෙන අතර මූල්‍ය වත්කම්වල හිමිකාරීත්වයේ සියලු අවදානම් හා වාසි පසුකාලීනව අරමුදලට හිමිවේ.

(ඇ) පසුකාලීනමිනුම

මූලික හඳුනා ගැනීමෙන් පසුව, හානි පාඩුසඳහා ප්‍රතිපාදනය අඩුකර, සළුල පොලී ක්‍රමය යොදා ගනිමින් ණය හා ලැබියයුතු දෑ ක්‍රමක්ෂය කරන ලද පිරිවැය මත මනිනු ලැබේ.

(ඇ) මූල්‍ය වත්කම්වල හානි පාඩු

මූල්‍ය වත්කමක් හානිවී ඇති බවට පරමාර්ථික සාක්ෂි නිබේදයන්න අරමුදල විසින් එක් එක් වාර්තාකරණ කාල සිමාව අවසානයේ තක්සේරුවක් සිදු කරනු ලැබේ. වත්කම (පාඩු ලබන අවස්ථාවක) මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවීම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් ඇති වීමේ ප්‍රතිඵලයක් ලෙස හානිය සඳහා පරමාර්ථික සාක්ෂි ඇති අවස්ථාවකදී පමණක් මූල්‍යමය වත්කමක් හානිවී, හානි පාඩු ඇති වන අතර, පාඩු සිදුවීම (හෝ සිදුවීම්) මඟින් විශ්වසනීය ලෙස තක්සේරුකළ හැකි මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහය කෙරේ බලපෑමක් ඇති කරවයි.

ක්‍රමක්ෂය වියදම් යටතේ රැගෙන යන ණය සහ ලැබිය යුතු දෑ සඳහා, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ අගයසහ මූල්‍ය වත්කම්වල මුල් සළුල පොලී අනුපාතයට වට්ටම් කර ඇති ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල (අනාගත ණය පාඩු හැර) වත්මන් වටිනාකම අතර වෙනස ලෙසය. මූල්‍ය වත්කම්වල ධාරණ අගයඅඩු වන අතර, අලාභයේ ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

පසු අවස්ථාවකදී, හානි පාඩු ප්‍රමාණය අඩු වුවහොත් එම අඩුවීම හානි පාඩු හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමක් ලෙස සැලකිය හැකි අතර, මීට පෙර හඳුනාගත් අගය පහත වැටීමේ නිවැරදි කිරීම් සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගෙන ඇත.

2.9 භාණ්ඩ තොග

අ)ජීව විද්‍යාත්මක වත්කම් වල කෘෂිකාර්මික නිෂ්පාදන වලින් නිපදවූ නිමි භාණ්ඩ

පිරිවැය හා ශුද්ධ උප ලබ්ධි අගයෙන් අඩු අගයට භාණ්ඩ තොග දක්වා ඇත. හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිත කරමින් පිරිවැය නිශ්චය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධිවිය හැකි වටිනාකම යනු නිමැයුම් පිරිවැය හා විකිණුම් වියදම් අඩු කර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල ඇස්තමේන්තුගත විකුණුම් මිල වේ.

ආ)පොහොර

සහනාධාර අඩුකොට පිරිවැය මත භාණ්ඩ තොග දක්වා ඇත. බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමවේදය භාවිතා කරමින් පිරිවැය තීරණය කර ඇත. හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිත කරමින් පිරිවැය නිශ්චය කරනු ලැබේ. මිශ්‍ර පොහොර වල පිරිවැය තුළ අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, වෙනත් සෘජු වියදම් හා ආශ්‍රිත නිෂ්පාදන පොදු කාර්ය අඩංගු වේ. ශුද්ධ උපලබ්ධි විය හැකි වටිනාකම යනු අදාළ විකිණුම් වියදම් අඩු කර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල සහනාධාර වටිනාකම වේ.

ඇ)ජීව විද්‍යාත්මක වත්කම් වලින් නෙලාගත් කෘෂිකාර්මික නිෂ්පාදන

අස්වැන්න ලබන අවස්ථාවේ විකිණීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන පිරිවැය අඩුකර ඒවායේ සාධාරණ වටිනාකම අනුව මනිනු ලැබේ. කෘෂිකාර්මික නිෂ්පාදනවලින් ලත් නිමි හා අර්ධ නිමිභාණ්ඩ තොග, කෘෂිකාර්මික නිෂ්පාදනවල සාධාරණ වටිනාකමට පරිවර්තනය කිරීමේ පිරිවැය එකතු කිරීම මඟින් අගය කරනු ලැබේ.

2.10 වෙළඳලැබිය යුතුදෑ

වෙළඳ ලැබිය යුතුදෑ යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී භාණ්ඩ විකිණීම වෙනුවෙන් ගණුදෙනුකරුවන්ගෙන් අයවීමට නියමිත මුදල්ය. සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් ක්‍රමවේදය (වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ) මඟින් මුදල් එකතු කර ගැනීමට අපේක්ෂා කරන අතර, වෙළඳණයගැතියන් සත්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. වෙළඳ ලැබිය යුතුදෑ මූලිකව සාධාරණ වටිනාකම (ඉන්වොයිස් වටිනාකම) මත හඳුනාගෙන ඇති අතර, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ලැබෙනු ඇතැයි විශ්වාස කරන අගය අඩුවීම් සඳහා ප්‍රතිපාදන සැලසීමකින් තොරව සත්‍ය ඉන්වොයිස් වටිනාකමට පසුකාලීනව ගණනය කරනු ලැබේ.

එක් එක් වාර්තාකරණ කාලය අවසානයේදි වෙළඳ ලැබිය යුතුදෑ හානිවී ඇති බවට පරමාර්ථික සාක්ෂි තිබේදැයි අරමුදල තක්සේරු කරනු ලැබේ. ගෙවීම් ඒකරාශි කිරීම, ණයකරුවන්ගේ සැළකියයුතු මූල්‍ය ගැටලු සහ ගෙවීම් පැහැර හැරීම ඇතුළු අරමුදලේ පසුගිය අත්දැකීම් වෙළඳ ලැබිය යුතුදෑ හානිවීම පිළිබඳ පරමාර්ථික සාක්ෂිවලට අඩංගු වේ. වෙළඳ ලැබිය යුතුදෑ හානිවී ඇති අතර, හානිවීම පිළිබඳ පරමාර්ථික සාක්ෂි තිබෙනම්, එකී හානිපාඩු සිදු වි ඇත. හානිවීම සඳහා වෙළඳ ලැබිය යුතුදෑ වෙන් වෙන්ව තක්සේරු කර ඇත.

2.11 මුදල් හා මුදල්සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ, මුදල් සහ මුදල් සමාන දෑ සඳහා අතේ ඇති මුදල්, බැංකු සමඟ කරන ලද කාලීන තැන්පතු, මාස තුනක මුල් කල්පිරීමක් සහිත හෝ ඊට අඩු බැංකු අයිරාවක් සහිත වෙනත් කෙටි කාලීන ඉතා ද්‍රවශීල ආයෝජන ඇතුළත් වේ.

2.12 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස්, ස්කන්ධප්‍රාග්ධනය ලෙස වර්ගීකරණය කර ඇත.

2.13 මූල්‍ය බැරකම්

අරමුදල, මූල්‍ය බැරකම් වෙනත් මූල්‍ය බැරකම්වලට වර්ගීකරණය කරනු ලැබේ. අරමුදලේ වෙනත් මූල්‍ය බැරකම්වලට වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ හා පොලී සහිත ණය ඇතුළත් වේ. වෙනත් මූල්‍ය බැරකම් මුලින් හඳුනාගනු ලබන්නේ සාධාරණ වටිනාකමකින් සහ සෘජුව ආරෝපණය කළ හැකි ඕනෑම ගනුදෙනු පිරිවැයක් යටතේය. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, මෙම මූල්‍ය බැරකම් සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ගණනය කෙරේ.

අරමුදල එහි කොන්ත්‍රාත් බැඳීම් අවසන් වූ විට, අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනා නොගනී.

2.14 වෙළඳගෙවියයුතුදෑ

වෙළඳ ගෙවිය යුතුදෑ යනු සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ලබා ගත් භාණ්ඩ හෝ සේවාවන් සඳහා ගෙවීමට ඇති බැරකමය. වෙළඳ ගෙවිය යුතුදෑ සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් චක්‍රය තුළ (වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ) ගෙවිය යුතු වන්නේ නම්, ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. එසේ නොවන අවස්ථාවකදී, ඒවා ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ.

වෙළඳ ගෙවිය යුතුදෑ මූලිකව සාධාරණ අගයට (ගනුදෙනුකරන මිල) හඳුනාගනු ලබන අතර, ඒවා පසුකාලීනව සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම්චක්‍රය තුළ ගෙවීමට අදහස් කරන බැවින් ගනුදෙනුකරන මිලට ගණනය කරනුලැබේ.

2.15 ණයගැනීම්

ණය ගැනීම් සාධාරණ අගය එනම්, දරන ලද ශුද්ධ ගනුදෙනු පිරිවැය මත මූලිකව හඳුනා ගැනේ. සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ණය ගැනීම් පසුව ක්‍රමක්ෂය පිරිවැයයටතේ සිදු කෙරේ.පාවෙන අනුපාතික ණය ගැනීම් එම කාලපරිච්ඡේදය තුළ පවතින පාවෙන පොලී අනුපාතිකය (සඵල පොලී අනුපාතිකය) භාවිත කරමින් ක්‍ර ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ එක් එක් පසු කාලසීමාව තුළ මනිනු ලැබේ. නෛතික සහ ලේඛන ගාස්තු ණය ගැනීම්වල ගනුදෙනු පිරිවැය ලෙස හඳුනා ගැනේ.

2.16 ණය ගැනීම් පිරිවැය

ණයගැනීමේ පිරිවැය ඒවාදරනු ලබන කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

2.17රජයේ ප්‍රදාන

ප්‍රදාන ලැබෙන බවට හා අරමුදල කොන්දේසි සියල්ල සපුරාලන බවට සැලකිය යුතු සහතිකයක් ඇති අවස්ථාවක රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරන අගයට හඳුනා ගැනේ.

වන්දි පුර්ණය කිරිමට සිදු වන ආනයන පිරිවැයට අදාළ පොහොර සහනාධාර විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. සහනාධාර ලැබෙන බවට ප්‍රමාණවත්සහතිකයක් ලබා දී ඇති දැනටමත් වියදම් කර ඇති ආනයන පිරිවැය සඳහා හානි පුර්ණය කළ යුතු පොහොර සහනාධාර ලැබීමට නියමිත සහනාධාර ලෙස හඳුනාගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණ වලට අදාළ රාජ්‍ය ප්‍රදාන විලම්බිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකීම්වලට ඇතුළත් කර ඇති අතර, සරල රේඛීය පදනම මත අදාළ වත්කම් වල අපේක්ෂිත ආයු කාලය අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇත.

මූල්‍යමය නොවන ප්‍රදාන මූල්‍යමය නොවන ධාරණ අගය ධාරණ අගයේ ප්‍රදාන හා වත්කම් යන දෙකම සළකා ගණනය කෙරේ.

2.18 ප්‍රවර්තන හා විලම්භිත බදු

අදාළ කාල සීමාව සඳහා බදු වියදම තුළ ප්‍රවර්තන හා විලම්බිත බදු ඇතුළත්වේ. වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගෙන ඇති අයිතම හැර විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ බදු හඳුනාගෙන ඇත. මෙහිදී වෙනත් විස්තීර්ණ ආදායමෙහි බදු හඳුනා ගැනීමක් කර ඇත. සථ්‍ය බදු අය කිරීම් දක්වා සිටින කාලයේ අරමුදල විසින් අනුගමනය කරන හා උපයන බදු ආදායමට අදාල බදු නීති අනුව ගණනය කෙරේ. වත්මන් ආදායම් බදු ගාස්තුව ගණනය කරනු ලබන්නේ අරමුදලේ ක්‍රියාකාරීත්වය සහ බදු අය කළ හැකි ආදායමක් උත්පාදනය කිරීම සඳහා අදාළ වන වාර්තාකරණ කාල සීමාව අවසානයේ පනවන ලද බදු නීති මත පදනම්වය. බදු බලධාරීන්ට ගෙවීමට අපේක්ෂා කරන මුදලේ වර්ගය අනුව සුදුසු පරිදි කළමනාකාරිත්වය විසින් ප්‍රතිපාදන වෙන් කෙරේ.

වත්කම් හා වගකීම්වල බදු පදනම් අතර, ඇති වන තාවකාලික වෙනස්කම් මත හා මූල්‍ය ප්‍රකාශවල ධාරණ අගයන් අනුව විලම්බිත බදු හඳුනා ගැනේ. ගිණුම්වලට හෝ බදුමය ලාභයට හෝ පාඩුවට අදාළ නොවන ව්‍යාපාරික සම්බන්ධයක් නොවන ගණුදෙනුවක් නිසා වන වත්කමක හෝ වගකීමක මුලික හඳුනා ගැනීමෙන් ඇති වන්නේනම් විලම්බිත බදු නොසළකා හැරේ. එහි දක්වා සිටින කාලයේ අවසන් දිනයට බලාත්මක බදු අනුපාත මත විලම්බිත බදු තීරණය කරන අතර, අදාළ විලම්බිත බදු වත්කම අත්කර ගත් පසු හෝ විලම්බිත ආදායම් බදු වගකීම පියවා ඇති අවස්ථාවක අදාළ කර ගැනීමට අදහස් කෙරේ.

විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් භාවිත කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභය ලබා ගත හැකි ප්‍රමාණයට පමණි.

ප්‍රවර්තන බදු වත්කම් ප්‍රවර්තන බදු වගකීම්වලට හිලව් කිරීමට නීතිමය බලය පවරන හිමිකමක් ඇති අවස්ථාවක හා එකම බදු ආයතනය විසින් පනවනු ලබන ආදායම් බදුවලට අදාල විලම්භිත බදු වත්කම් හා වගකීම් ඇති අවස්ථාවක විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලවු කරනු ලැබේ.

2.19 සේවක ප්‍රතිලාභ

අරමුදල සතුව නිශ්චිත ප්‍රතිලාභ හා නිශ්චිත දායකත්ව සැළසුම් යන දෙකම පවති.

(අ) නිශ්චිත දායකත්ව සැළැස්ම

නිශ්චිත දායකත්ව සැළැස්මක් යනු අරමුදල විසින් වෙනම ආයතනයක් වෙත ස්ථාවර දායකමුදල් ගෙවනු ලබන පශ්චාත්-රැකියා ප්‍රතිලාභ සැළැස්මකි. තවදුරටත් දායක මුදල් ගෙවීම සඳහා අරමුදලට කිසිදු නෛතික හෝ සාධනීය බැඳීම් නොමැත. දායක මුදල් ගෙවිය යුතු විට ඒවා සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනා ගැනේ.

අරමුදල මඟින් සේවක අර්ථසාධක අරමුදලට කර්මාන්තශාලා සේවකයන් සඳහා දල පාරිශ්‍රමිකවලින් 12%ක දායකත්වයක් හා වෙනත් සේවකයන් සඳහා 15%ක දායකත්වයක් ලබාදෙන අතර, සේවක භාරකාර අරමුදල සඳහා සේවකයාගේ දල පාරිශ්‍රමිකවලින් 3% කදායකත්වයක් ලබාදේ.

(ආ) නිශ්චිතප්‍රතිලාභ සැළැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් සම්බන්ධයෙන් අරමුදල් බැඳීම යනු වාර්තාකරණ කාල සීමාව අවසානයේ වූ නිශ්චිත ප්‍රතිලාභ වගකීමේවර්තමාන වටිනාකමයි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම වාර්ෂිකව මනිනු ලබන්නේ පාරතෝෂික සූත්‍රය භාවිතා කර ගණනය කරන ලද අපේක්ෂිත ඒකක ණය ක්‍රමය භාවිත කරමිනි. නිශ්චිත ප්‍රතිලාභ බැදීම්වල සත්‍ය වටිනාකම සේවකයන් හා පෙර කාල සීමාවලදී තම සේවා සැපයීම මඟින් උපයන ලද ඇස්තමේන්තු කළ ඉදිරි ප්‍රතිලාභ සඳහා වට්ටම් කිරීමෙන් නිශ්චය කරනු ලැබේ.

උපකල්පනවල වෙනස්වීම්, වත්මන් සේවා පිරිවැය සහ පොලී වෙනස්වීම් වලින් පැන නගින ලාභ සහ අලාභ ඒවා පැන නගින කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමසඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

(ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වගකීම් මනිනු ලබන්නේ සේවකයින් විසින් සපයනු ලබන අදාළ සේවාවන් සඳහා ගෙවීමට අපේක්ෂා කරන වට්ටම් රහිත මුදලක් මත ය.

2.20 ප්‍රතිපාදන හා අසම්භාව්‍ය බැරකම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අරමුදලට වර්තමාන නෛතික හෝ සාධනීය වගකීමක් ඇතිවිට නීත්‍යානුකූල හිමිකම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම් සඳහා වන ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ, අරමුදලෙන් ආර්ථික සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වන අතර ප්‍රමාණයන් විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකිය.

ශේෂ පත්‍ර දිනය වන විට විභාග වෙමින් පවතින නීතිමය නඩුවල තත්ත්වය වන්නේ තේ ශක්ති අරමුදලට විවිධ පාර්ශ්වවලට එරෙහිව නඩු 14ක් පවරා ඇති අතර, ඉන් නඩු 2ක් තේ ශක්තිට පක්ෂව ලබා දී තිබීමයි. පාර්ශව 12ක් තේ ශක්තියට එරෙහිව නඩු පවරා තිබූ අතර, එහි ප්‍රතිඵලය ශේෂ පත්‍ර දිනයේදී සාධාරණ ලෙස තහවුරු කර ගත නොහැකි විය.

වර්තමාන බැඳීම හා සම්බන්ධ අවදානම් සහ අවිනිශ්චිතතාවයන් ඇතුළුව, වාර්තා කරන දිනයේ පවතින වඩාත්ම විශ්වාසදායක සාක්ෂි මත පදනම්ව, වර්තමාන වගකීම පියවීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම් මත ප්‍රතිපාදන මනිනු ලැබේ.

සම්පත් පිටතට ගලා යාමේ හැකියාව දුරස්ථ නොවේ නම් මිස සියලු අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහනක් ලෙස අනාවරණය කරනු ලැබේ.

2.21 ආදායම් හඳුනාගැනීම

සාධාරණ අගයට ආදායම ගණනය කරනු ලැබේ.ආදායම ලත් හෝ ලැබීමට ඇති මිලෙහි සාධාරණ අගයට ගණනය කරනු ලබන අතර, ශුද්ධ වටිනාකම් එකතු කළ බදු (VAT) හා ජාතික ගොඩනැගීමේ බද්දෙහි (NBT) සඳහන් අරමුදලේ ක්‍රියාකාරකම්වලදී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන මුදල දැක්වේ. ආදායම් මුදල විශ්වාසදායිව මැණිය හැකි අවස්ථාවක හා ඉදිරි ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමට හැකි තත්වය තුළ ආදායම් ප්‍රමාණය අරමුදල හඳුනා ගනී.

එක් එක් හඳුනාගත හැකි ප්‍රධාන ආදායම් මාර්ග සඳහා අරමුදලපහත දක්වා ඇති ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායකඅදාළ කරයි.

(අ)භාණ්ඩ අලෙවිය

භාණ්ඩ අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ, භාණ්ඩවල අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත ලැබී ඇති අවස්ථාවේදී, එනම් ගබඩාවලින් භාණ්ඩ ලබා දෙන අවස්ථාවේදීය.

(ආ)තේ තැරැව්කරුවන්ට අලෙවි කිරීම්
තේ තැරැව්කරුවන් හරහා සිදු කළ තේ අලෙවිය මඟින් ලත් ආදායම වෙළඳ පොලේදී තේ තැරැව්කරුවන් පාරිභෝගිකයාට විකුණා භාරදුන් භාණ්ඩ වල අවදානම් හා ප්‍රතිලාභ මත හඳුනාගෙන ඇත. තේ තැරැව්කරුවන්ට විකිණීමෙන් ලත් ආදායම ඉන්වොයිස් වටිනාකමට තැරැව් ගාස්තු, අලෙවි වියදම් හා බදු වල ශුද්ධ අගයට සටහන් කෙරේ.

(ඇ)පොලි ආදායම
සඵල පොලී ක්‍රමවේදය යොදාගනිමින් පොලි ආදායම් හඳුනා ගෙන ඇත.

(ඈ)දේපල, පිරියත හා උපකරණ අපහරණයෙන් ලදලාභසහ අලාභ
අපහරණය මඟින් ඇතිවන ලාභසහ අලාභ නිශ්චය කරනු ලබන්නේ එයින් උපයන ලද මුදල ධාරණ අගය සමඟ සන්සන්දනය කිරීමෙන් වන අතර, එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

(ඉ)වෙනත්ආදායම්
උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනා ගෙන ඇත.

2.22 වියදම්
මෙහෙයුම් සිදු කිරීමේදී වන වියදම් අදාළ කාලසීමාව තුළ ලාභය ඉපයීම සඳහා වන ආදායමයි.

2.23 වාර්තාකරණ කාලසීමාවට පසුව සිදුවන සිදුවීම්
මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන කාල සීමාවට පසුව සිදු වූ ද්‍රව්‍යාත්මක සිදුවීම් සියල්ල කෙරේ අවධානය යොමු කර සුදුසු ගැලපීම් හෝ හෙලිදරවුකිරීම් මූල්‍ය ප්‍රකාශවල අදාල සටහන්වල සිදු කර ඇත.

2.24 බැදීම්
වාර්තාකරණ කාල සීමාව අවසානයේදී පැවති ද්‍රව්‍යාත්මක බැඳීම් සියල්ල හඳුනාගෙන ඇති අතර, මූල්‍ය ප්‍රකාශවල සටහන් මඟින් දක්වා ඇත.

3. නිකුත්කර ඇති එහෙත් මෙතෙක්ක්‍රියාත්මක නොවනශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති /ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති(SLFRS/LKAS)
මූල්‍ය ප්‍රකාශ නිකුත් කරන දිනය වන විට නිකුත් කර ඇති එහෙත් මෙතෙක් ක්‍රියාත්මක නොවන ප්‍රමිති පහත දක්වා ඇත. ඒවා බලාත්මකවන අවස්ථාව වනවිට එම ප්‍රමිති අනුගමනය කිරීමට අරමුදල බලාපොරොත්තු වේ.

අ)ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9- මූල්‍ය ලියවිලි:LKAS39 වෙනුවට SLFRS 9 නිකුත් කර ඇති අතර, එහි දක්වා ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හඳුනා ගැනීම, වර්ගීකරණය හා තක්සේරු කිරීමට අදාළ වේ. 2015 ජනවාරි 01 දිනෙන් හෝ ඊට පසුව ඇති වාර්ෂික කාලසීමාවන් සඳහා මෙම ප්‍රමිතිය අදාළ වේ.

ආ)ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13-සාධාරණ වටිනාකම් මිනුම:සාධාරණ වටිනාකම් මැනීම් හා හෙලිදරවු කිරීම් සියල්ල සඳහා මාර්ගෝපදේශ SLFRS 13 තුළ ඇත. මෙම ප්‍රමිතිය මඟින් මූල්‍ය තත්ත්වය හා කාර්යසාධනය කෙරේ ඇති කරවිය හැකි බලපෑම මේ වන විට අරමුදල තක්සේරු කරමින් සිටී. 2014 ජනවාරි 01 දිනෙන් හෝ ඊට පසුව ඇති වාර්ෂික කාල සීමාවන් සඳහා මෙම ප්‍රමිතිය අදාළ වේ.

4. විශේෂ ගිණුම්කරණ ඇස්තමේන්තු හා විනිශ්චයන්
මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී කළමණාකරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම හා වියදම් හඳුනාගැනීම හා මිනුම පිළිබඳව විනිශ්චයන්, ඇස්මේන්තු හා උපකල්පනයන් සිදු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ කෙරෙහිවඩාත් විශේෂී ලෙස බලපාන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේදී ගනු ලබන විශේෂ විනිශ්චයන් පහත දක්වා ඇත.

(අ) විලම්බිත බදු වත්කම් හඳුනාගැනීම

හඳුනා ගත හැකි විලම්භිත බදු වත්කම් වල ප්‍රමාණය විලම්භිත බදු ආදායම භාවිත කළ හැකි ඉදිරි බදු ආදායම් ප්‍රමාණයේ තක්සේරුව මත පදනම් වනු ඇත.

වත්කම්, වගකීම්, ආදායම සහ වියදම් හඳුනා ගැනීම හා මැනීම කෙරෙහි වඩාත්ම වැදගත් බලපෑමක් ඇති ඇස්තමේන්තු සහ උපකල්පන පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(ආ) ක්ෂයවිය හැකි වත්කම්වල ඵලදායී ආයුකාලය

ක්ෂයවිය හැකි වත්කම්වල ඵලදායී ආයු කාලයේ තක්සේරුව කළමනාකාරිත්වය විසින් දන්වා සිටින දිනට වත්කම්වල අපේක්ෂිත ආර්ථික උපයෝගිතාවය මත පදනම්ව විමසුමට ලක් කරයි. මෙම ඇස්තමේන්තුවල ඇති අනියතතාවයන් ඇතැම් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණ උපකරණ භාවිත කිරීම වෙනස් කිරීමට හේතු විය හැකි තාක්ෂණ හැකියාවට අදාළ වේ.

(ඇ) නිශ්චිත ප්‍රතිලාභ සැළසුම

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම්වල සත්‍ය වටිනාකම උපකල්පන රැසක් භාව කරමින් යෝජිත ඒකක ණය පදනම මත රදා පවතින කරුණු රැසක් මත තීරණය වේ. ශුද්ධ පිරිවැය හා වට්ටම් අනුපාතය ඇතුළුව නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම සඳහා වන බැඳීම 26 වන සටහනෙහි දක්වා ඇත. මෙම උපකල්පන වල කිසියම් වෙනසක් ඇතිවීම නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ධාරණ අගයට බලපෑමක් සිදු කෙරෙනු ඇත.

5. SLFRS/LKAS ප්‍රථම වරට යොදා ගැනීම

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වාර්තාකරණ කාලසීමාව සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව ප්‍රථම වරට සැකසූ මූල්‍ය ප්‍රකාශ වේ. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වාර්තාකරණ කාලසීමාව ඇතුළු පෙර වාර්තාකරණ කාලසීමාවන් දක්වා කාලයන්ට අදාළව අරමුදල තම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව 2012 දෙසැම්බර් 31 වන තෙක් සකස් කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී, ආරම්භක මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) මාරුවන දිනය වන 2011 ජනවාරි 1 දිනට සකස් කරන ලදි. මෙම සටහන මඟින් 2011 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වන කාල සීමාව සඳහා ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අදාළ මූල්‍ය ප්‍රකාශ සිදු කළ ප්‍රධාන ගැලපුම් පැහැදිලිව දැක්වේ. මෙම සටහන මඟින් 2011 ජනවාරි 01 සිට 2011 දෙසැම්බර් 31 දක්වා වන කාල සීමාව සඳහා ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) මූල්‍ය ප්‍රකාශවල සිට SLFRS මූල්‍ය ප්‍රකාශ දක්වාසිදු කරන ලද ප්‍රධාන ගැලපුම් පැහැදිලිව දැක්වේ.

5.1 අතීතානුයෝගී යෙදුම මඟින් විකල්පමය නිදහස් කිරීම්

1.ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව පළමු මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, අනෙකුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (SLFRSs) අතීතානුයෝගී යෙදුමෙන් පහත විකල්ප නිදහස් කිරීම් අයදුම් කිරීමට අරමුදල තෝරාගෙන ඇත.

අ. සාධාරණ අගය හෝ කල්පිත පිරිවැය ලෙස ප්‍රත්‍යාගණනය

2011 දෙසැම්බර් 31 දිනට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවසකස් කරන ලද මූල්‍ය තත්ත්වය ප්‍රකාශය තුළ දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන දේපලවල ප්‍රත්‍යාගණන මිලට දක්වා ඇත. ප්‍රත්‍යාගණන දිනට සාධාරණ වටිනාකමට බොහෝ සේ සැසඳෙන බැවින්, එම ප්‍රත්‍යාගණන මුදල ප්‍රත්‍යාගණනය කළ දිනට කල්පිත පිරිවැයක් ලෙස අරමුදල සළකනු ලැබේ.

2. පහත දැක්වෙන විකල්පව්‍යාතිරේක ගිණුම් ප්‍රමිතින්තේ ශක්ති අරමුදලගිණුම්සකස්කිරීමට අදාළ නොවේ:

අ. SLFRS 4 - මෙම යෙදවුම අරමුදල්වලට අදාළ නොවන බැවින්, රක්ෂණ ගිවිසුම්

ආ. IFRIC 4 - කල්බදු අඩංගු ව තිබේදැයි තීරණය කිරීම - අරමුදල සතුව එවැනි සැකසීමක් නොමැති බැවිනි

ඇ. LKAS 19 - සූත්‍ර ක්‍රමය භාවිතකර අරමුදල තම නිශ්චිත ප්‍රතිලාභ වගකීම් පිළියෙල කරන බැවින්, සේවක ප්‍රතිලාභ

ඈ. LKAS 21 -අරමුදල සතුව විදේශ මෙහෙයුම් නොමැති බැවින්, සමුච්චිත පරිවර්තන විනිමය විචල්‍යතා

ඉ. LKAS 27-අරමුදල සතුව සමූහ ආයතන නොමැති බැවින්, අනුබද්ධිත ආයතන, හවුල් පාලන ආයතන හා සංගම් වල ආයෝජන

ඊ. අරමුදල සතුව සමූහ ආයතන නොමැති බැවින්, අනුබද්ධිත ආයතන, සංගම් හා හවුල් ව්‍යාපාරවල වත්කම් හා බැරකම්

උ. LKAS 32 - සංකීර්ණ මූල්‍ය උපකරණ අරමුදල සතුව නොමැති බැවින්සංකීර්ණ මූල්‍ය උපකරණ

ඌ. LKAS 39 -පෙර වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ අරමුදලට AFS සහ FVTPL මූල්‍ය උපකරණ නොමැති බැවින්, පෙර හඳුනාගත් මූල්‍ය උපකරණ නම් කිරීම

එ. දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධව ඉවත් කිරීමේ වගකීම් අරමුදලට නොමැති බැවින්, ඉවත් කිරීමේ වගකීම් දේපල, පිරියත සහ උපකරණවල පිරිවැයට ඇතුළත් කර ඇත.

ඒ. IFRIC 12 - සේවා සහන වැඩපිළිවෙළ - එවැනි වැඩපිළිවෙළක් අරමුදල සතුව නොමැති බැවිනි

5.2 අතීතානුයෝගීයෙදුම මගින් අනුගම්‍ය ව්‍යාතිරේකයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව ප්‍රථම මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී, අනෙකුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (SLFRS) අතීතානුයෝගී යෙදුමෙන් පහත සඳහන් අනිවාර්ය ව්‍යතිරේක යෙදීමට අරමුදල බලාපොරොත්තු වේ.

1. ගිණුම්කරණ ඇස්තමේන්තු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට (SLFRSs) මාරු වීමේ දිනය වන විට හා 2013 දෙසැම්බර් 31 දිනට වන සියළු ගිණුම්කරණ ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඇස්තමේන්තුවලට අනුව සකසා ඇත.

2. පහත දැක්වෙන අනුගම්‍ය ව්‍යාතිරේකයන් අරමුදලට අදාළ නොවේ:

අ. මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හඳුනා නොගැනීම

ආ. හෙජ් ගිණුම්කරණය(Hedge Accounting)

ඇ. පාලනය නොවන පොලී

5.3 SLFRSs වෙත මාරුවීම පිළිබඳව පැහැදිලි කිරීම

2 සිට 4 දක්වා වන සටහන්වල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශ මෙන්ම 2011 දෙසැම්බර් 31 අවසන් වන වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක තොරතුරු සැකසීමේ දී හා SLFRSවලට මාරු වීමේ දිනය වන 2011 ජනවාරි 1 දිනට SLFRS ප්‍රකාශය ඇරඹීමේ දී යොදා ගෙන ඇත.

SLFRS සැකසීමේ දී, ශ්‍රී ලංකා ගිණුම්කරණප්‍රමිතිවලට අනුකූලව අවශ්‍ය කරන ගැලපීම් පෙර දක්වා සිටින කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශවල සිදු කර ඇත. SLAS සිට SLFRS දක්වා මාරුවීමේ ඵලයන් සම කොටස් සැසඳුම් ප්‍රකාශයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හා ගැලපුම් සටහන්වල දක්වා ඇත.

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සටහන්	2014	2013
6 ආදායම		
තේ අලෙවිය	556,475,091	705,746,466
දේශීය තේ අලෙවිය	28,607,143	31,402,999
කසල තේ අලෙවිය	5,626,443	6,129,858
පොහොර අලෙවිය	31,277,680	30,250,600
අමු ද්‍රව්‍ය සෘජු අලෙවිය	326,302	322,363
පොහොර අලෙවි වට්ටම	(722,985)	(818,847)
	621,589,674	**657,698,223**
7 වෙනත් ආදායම්		
ලියා හැරීම් / ආපසු ලියා හැරීම් - කුඩා තේවතු සංවර්ධන අධිකාරිය		
ලියා හැරීම් / ආපසු ලියා හැරීම් රාජ්‍ය සංක්‍රාම ලියාහැරීම		
වෙනත් ආදායම්		
තේ වතු ආදායම	11,327,571	9,503,156
ප්‍ර/කා ගාස්තු (කර්මාන්තශාලා)	30,072,600	32,782,639
ප්‍රමාදවීමේ ගාස්තු ආදායම		
කුලී ආදායම	1,208,010	1,970,493
සුළු ආදායම	1,476,879	435,986
	44,085,060	**44,692,274**
8 ශුද්ධ මූල්‍ය පිරිවැය		
පොලී ආදායම		
ස්ථිර තැන්පත් පොලිය	6,617,864	8,758,135
	6,617,864	**8,758,135**
පොලී වියදම්		
බැංකු ණය පොලී	16,704,848	13,428,522
	16,704,848	**13,428,522**
	10,086,984	**4,670,387**

9 බදු පැනවීමට පෙර ලාභය

බදු පෙර ලාභය පහත කරුණු ඇතුළුව සියළු වියදම් සඳහන් කිරීමෙන් පසුව සැකසේ.

විගණකවරුන්ගේ පාරිශ්‍රමික
ස්ථාවර වත්කම් ක්ෂය වෙන් කිරීම්
ස්ථිර ප්‍රතිලාභ සැළසුම් පිරිවැය - විශ්‍රාම පාරිතෝෂිතය
සේවක පිරිවැය

10 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 16 වන වගන්තිය යටතේ 2006 /04/ 1 දින සිට වසර පහක කාලයක් දක්වා අරමුදල බදු වලින් නිදහස් කර ඇති අතර එම නිදහස් කිරීම 2011 වසරේ දී අවසන් විනි. මේ වන විට අරමුදල බදු බැරකම් තත්ත්වය දේශීය ආදායම් පනතට අනුව තක්සේරු කරමින් සිටී. එහි ප්‍රතිඵලයක් ලෙස නිදහස් කළ කාල සීමාව සඳහා කිසිදු ප්‍රතිපාදන සැළසීමක් කර නොමැත.

11 කොටසක මූලික ඉපයීම (රු.)		
ශුද්ධ ලාභය (රු.)	(127,823,734)	(59,365,788)
සාමාන්‍ය කොටස් හිමියන්ගේ		
නිකුත් කරන බර තැබූ සාමාන්‍ය කොටස් ප්‍රමාණය (සංඛ්‍යාව)	20,601,415	20,601,415
කොටසක මූලික ඉපයීම (රු.)	**(6.20)**	**(2.88)**

කොටසක මූලික ඉපයීම් සමකොටස් දරන්නන්ට දක්ව සිටින කාලය තුල අත්විය යුතු ලාභය නිකුත් කරන බරතැබූ සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් බෙදීමෙන් ගණනය කෙරේ.

වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අවකරණ දැක්වේ.
මූල්‍ය ප්‍රකාශන වල සටහන් පසු පිටට

2014 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වල සටහන්

12 දේපල පිරියත හා උපකරණ

	සින්නක්කර									
පිරිවැය හෝ ඇගයුම	ඉඩම් හා ගොඩනැගිලි	පිරියත හා යන්ත්‍රෝපකරන	වාහන	ලී බඩු හා උපකරණ	පරිගණක	උපකරණ හා මෙවලම්	දුරකතන	ඉඩම් හා ගොඩනැගිලි	ලී බඩු හා උපකරණ	එකතුව
2013 දෙසැම්බර් 31 දිනට ශේෂය	**218,914,782**	**306,424,893**	**25,373,359**	**4,416,272**	**4,438,500**	**3,293,937**	**330,200**	**-**	**-**	**563,191,944**
එකතු කිරීම්	**85,250**	680,907			**126,747**	**163,500**				**1,056,404**
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	**219,000,032**	**307,105,800**	**25,373,359**	**4,416,272**	**4,565,247**	**3,457,437**	**330,200**	**-**	**-**	**563,191,944**
ක්ෂය වෙන් කිරීම්										
2013 දෙසැම්බර් 31 දිනට ශේෂය	**29,121,604**	**151,755,349**	**20,367,239**	**3,227,566**	**1,597,647**	**2,259,241**	**237,247**	**-**	**-**	**208,565,893**
වසරේ අයකිරීම්	**4,207,316**	**22,956,348**	**2,129,880**	**447,302**	**455,532**	**316,771**	**34,694**			**30,547,843**
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	**33,328,920**	**174,711,697**	**22,497,119**	**3,674,868**	**2,053,179**	**2,576,012**	**271,941**	**-**	**-**	**239,113,736**

ශුද්ධ ධාරන අගයන්	**2014**	**2013**
සින්නක්කර වත්කම්		
ඉඩම් හා ගොඩනැගිලි	185,671,112	189,793,178
පිරියත හා උපකරණ	132,394,103	154,669,544
වාහන	2,876,240	5,006,120
ලී බඩු හා උපාංග	741,404	1,188,706
පරිඝනක	2,512,068	2,840,853
උපකරණ හා මෙවලම්	881,425	1,034,696
දුරකථන	58,259	92,953
කල්බදු වත්කම්		
ඉඩම් හා ගොඩනැගිලි		-
ලී බඩු හා උපාංග		-
	325,134,612	**354,626,052**
කෙරිගෙන යන නොනිමි වැඩ	5,641,342	3,945,664
	330,775,955	**358,571,716**

වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අවකරණ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන වල සටහන් පසු පිටට

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සටහන්	2014	2013
12.1 නොනිමි ප්‍රාග්ධන කාර්යයන් (ගොඩනැගිලි/ පිරියත & යන්ත්‍රෝපකරණ)		
ජනවාරි 01 දිනට ශේෂය	**3,945,664**	**3,249,903**
එකතු කිරීම්	1,695,678	695,761
දෙසැම්බර් 31 දිනට ශේෂය	**5,641,342**	**3,945,664**
13 අපෘෂ්ඨ වත්කම්		
පරිසණක මෘදුකාංග		
පිරිවැය		
ජනවාරි 01 දිනට ශේෂය	**2,435,000**	**2,435,000**
එකතුවීම්		-
දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,435,000**	**2,435,000**
ශුද්ධ ධාරන අගය	**2,435,000**	**2,435,000**
14 ආයෝජන වත්කම්		
පිරිවැය		
ඉඩම්		
ජනවාරි 01 දිනට ශේෂය	12,225,000	12,225,000
එකතු කිරීම්		-
දෙසැම්බර් 31 දිනට ශේෂය	**12,225,000**	**12,225,000**
ගොඩනැගිලි		
ජනවාරි 01 දිනට ශේෂය	**17,274,250**	**17,274,250**
එකතු කිරීම්		-
දෙසැම්බර් 31 දිනට ශේෂය	**17,274,250**	**17,274,250**
ක්‍රමක්ෂය		
ජනවාරි 01 දිනට ශේෂය	**11,898,187**	**10,311,762**
වසරේ අයකිරීම්	1,586,427	1,586,425
දෙසැම්බර් 31 දිනට ශේෂය	**13,484,614**	**11,898,187**
ශුද්ධ පොත් වටිනාකම		
ඉඩම්	**9,044,688**	**9,332,813**
ගොඩනැගිලි	**6,969,948**	**8,268,248**
	16,014,636	**17,601,061**

වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අවකරණ දැක්වේ.
මූල්‍ය ප්‍රකාශන වල සටහන් පසු පිටට

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සටහන්	2014	2013
15 නොමේරූ වගා (තේ)		
පිරිවැය		
ජනවාරි 01 දිනට ශේෂය	**4,749,958**	**2,337,881**
එකතු කිරීම්	2,569,462	2,412,077
දෙසැම්බර් 31 දිනට ශේෂය	**7,319,420**	**4,749,958**
ක්‍රමක්ෂය		
ජනවාරි 01 දිනට ශේෂය	**1,107,563**	**764,214**
වසරේ අයකිරීම්	592,250	343,349
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,699,813**	**1,107,563**
ශුද්ධ පොත් වටිනාකම් වල එකතුව	**5,619,607**	**3,642,395**
නොමේරූ වගා (තේ)		
පිරිවැය		
ජනවාරි 01 දිනට ශේෂය	**8,174,111**	**8,282,588**
එකතු කිරීම්	2,203,652	2,303,600
මාරු කිරීම්	(2,569,462)	(2,412,077)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**8,174,111**	**8,174,111**
මූළු ශුද්ධ පොත් වටිනාකම් වල එකතුව	**13,427,908**	**11,816,506**

වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අවකරණ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන වල සටහන් පසු පිටට

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සටහන්		2014	2013
16 මූල්‍යනය			
මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වර්ග			
මූල්‍ය තත්වය ප්‍රකාශනයේ සඳහන් මූල්‍ය වත්කම් හා බැරකම් වල ධාරන			
මූල්‍ය වත්කම් හා බැරකම් වල ධාරන අගයන්			
මූල්‍ය වත්කම්	සටහන		
ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල්			
වෙළඳ ණයගැතියෝ හා වෙනත් ලැබිය මුදල්	**(18 සටහන)**	274,665,507	270,054,571
මුදල් හා මුදල්වලට සමාන දෑ	**(19 සටහන)**	6,891,350	10,607,999
		281,556,857	**280,662,570**
ණය හා ලැබීමට නියමිත දෑ ඒවායේ සාධාරන අගයට ආසන්න බැවින් ඒවායේ ධාරන අගයට දක්වා ඇත.			
මූල්‍ය වත්කම් එකතුව		**281,556,857**	**280,662,570**
මූල්‍ය බැරකම්			
වෙනතව් මූල්‍ය බැරකම්			
ණයගැනීම්	**(25 සටහන)**	18,381,397	13,455,505
වෙළඳ හිමියෝ හා වෙනත් ගෙවිය යුතු දෑ	**(27 සටහන)**	315,491,677	257,614,853
බැංකු අයිරා	**(20 සටහන)**		48,408,111
		333,873,074	**319,478,469**
වෙනත් මූල්‍ය බැරකම් සාධාරන අගය එහි ධාරන අගයන්ට ආසන්න වන බැවින් ධාරන අගය අනුව දක්වා ඇත.			
මූල්‍ය බැරකම් එකතුව		**333,873,074**	**319,478,469**

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සටහන්		2014	2013
17 තොග			
කර්මාන්තශාලා තේ තොග		42,169,446	40,900,709
ගඩඩා/ තැරැව්කාරයන් වෙතැති තේ තොග		58,554,688	91,421,609
අමුද්‍රව්‍ය		1,213,600	2,963,493
නිමි ද්‍රව්‍ය		863,537	309,985
දේශීය තේ අලෙවි අංශයේ වෙනත් තේ තොග		1,982,699	1,685,257
පොදු තොග		8,499,035	7,165,883
ලිපිද්‍රව්‍ය		183,075	385,400
පොහොර තොග		584,851	458,521
		114,050,931	**145,290,858**
තොග අගය පහත වැටීම් සඳහා වෙන් කිරීම්			
		114,050,931	**145,290,858**
18 වෙළඳ හා ණයගැතියෝ හා වෙනත් ලැබිය යුතු දෑ			
වෙළඳ ණයගැතියෝ	**(18.1 සටහන)**	126,568,420	131,334,168
තැන්පත් හා අත්තිකාරම්	**(18.2 සටහන)**	40,322,856	40,409,793
වෙනත් ලැබිය යුතු දෑ	**(18.3 සටහන)**	96,160,834	86,697,214
ලැබිය යුතු සහනධාර			2,796,621
විලම්භනය කල වියදම්			
		263,052,111	**261,237,796**
18.1 වෙළඳ ණයගැතියෝ		138,181,816	142,947,564
අගය පහත වැටීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්		(11,613,396)	(11,613,396)
		126,568,420	**131,334,168**
18.2 තැන්පත් හා අත්තිකාරම්			
තැන්පත්		2,578,400	1,908,176
ගෙවූ අත්තිකාරම්		37,744,457	38,501,617
		40,322,857	**40,409,793**
18.3 වෙනත් ලැබීමට නියමිත දෑ			
ලැබීමට නියමිත පොලී		50,968,658	44,723,885
වෙනත්		52,933,216	49,714,369
		103,901,874	**94,438,254**
අගය පහත වැටීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්		**(7,741,040)**	**(7,741,040)**
		96,160,834	**86,697,214**

වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අවකරණ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන වල සටහන් පසු පිටට

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන්		2014	2013
19	**නිත්‍යානුකූල ලැබිය යුතු දෑ**		
	ආර්ථික සේවා ගාස්තු (ESC)	3,415,813	3,806,028
		3,415,813	**3,806,028**
20	**මුදල් හා මුදල්වලට සමාන දෑ**		
	හිතකර ශේෂ		
	අතැති මුදල්	206,577	62,992
	බැංකුගත මුදල්	6,684,772	10,545,007
		6,891,349	**10,607,999**
	අහිතකර ශේෂ		
	බැංකු අයිරා		**(48,408,111)**
	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා වන මුදල් හා මුදල් වලට සමාන දෑ	**6,891,349**	**(37,800,112)**
21	**ප්‍රකාශිත ප්‍රාග්ධනය**		
	නිකුත්කළ හා සම්පූර්ණයෙන්ම ගෙවන ලද		
	සාමාන්‍ය කොටස් 20601415	206,014,150	208,959,130
	සාමාන්‍ය කොටස් ප්‍රතිමිලදි ගැනීම		(2,944,980)
		206,014,150	**206,014,150**
22	**සාමාජිකයන්ගේ යහසාධන රක්ෂණ අරමුදල**		
	සාමාජිකත්ය දායකවීම්		
	ජනවාරි 01 දිනට ශේෂය	135,089,150	**135,001,425**
	වසරේ අයකිරීම්	95,600	87,725
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**135,184,750**	**135,089,150**
23	**රාජ්‍ය ප්‍රාග්ධන සංක්‍රාම**		
	ජනවාරි 01 දිනට ශේෂය	**350,004,024**	**393,754,527**
	වසරේ අයකිරීම්	**25,550,000**	
	රාජ්‍ය ප්‍රධාන ලියාහැරීම	(43,750,503)	(43,750,503)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**331,803,521**	**350,004,024**

කුඩා තේ වතු හිමියන්ගේ කේවල් කිරීමේ බලය තහවුරු කිරීම සඳහා කර්මාන්තශාලා ඇරඹීමට ශ්‍රී ලංකා රජ රජයෙන් උක්ත ප්‍රදාන ලැබී ඇත. ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි නොමැතිවීම නිසා ප්‍රාග්ධන වත්කම් හෝ මෙහෙයුම් වියදම් සඳහා මෙම ප්‍රතිපාදන යොදා ගෙන ඇත්දැයි සනාථ කර ගැනීමට අරමුදලට හැකියාවක් නොමැත. පසුකාලීනව එකී ප්‍රදාන මුදල 2012 මුදල් වසරේ සිට වසර දහයක කාලයක් සඳහා ආපසු ලියා හැරීමට අදාළව 2014 පෙබරවාරි 18 වන දින යෝජනාවක් (යෝජනා අංක 152.33) අධ්‍යක්ෂක මණ්ඩලය සම්මත කරගෙන ඇත.

24	**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**		
	ජනවාරි 01 දිනට ශේෂය		
	ලියා හැරීම් / ආපසු ලියා හැරීම් බැරකම්		
	දෙසැම්බර් 31 දිනට ශේෂය		

තේ ශක්ති අරමුදල වෙනුවෙන් කළ වියදම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ශුද්ධ මුදල දිගු කාලයක් පුරා නි බැරකමක් ලෙස හඳුනා ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව කුඩා තේ වතු සං අධිකාරියට දිගු කාලයක් පුරා ගෙවීමට නිහ ආපසු ලියා හැරීමට තම අනුමැතිය ලබා දී ඇත.

25	ණය ගැනීම			
	ප්‍රවර්ථන වසරින් පසු ගෙවිය යුතු		13,455,505.00	9,574,365.00
	කාලීන ණය	**(25.1 සටහන)**	13,455,505.00	9,574,365.00
	ප්‍රවර්ථන වර්ෂයේ ගෙවිය යුතු			
	කාලීනණය	**(25.1 සටහන)**	4,925,892.00	3,881,140.00
			4,925,892.00	3,881,140.00
	බැංකු අයිරා	**(20 සටහන)**		48,408,111.00
			18,381,397.00	**57,982,476.00**

වරහන් තුල ඇති සංඛ්‍යා මඟින් අවකරණ දැක්වේ.
මූල්‍ය ප්‍රකාශන වල සටහන් පසු පිටට

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන්	2014	2013
25 ණයගැනීම්		
ප්‍රවර්ථන වසරින් පසු ගෙවිය යුතු		
කාලීන ණය		
	-	
ස්ථීර හා චලන අනුපාත මත සිදු කළ ණයගැනීම් වල ධාරන අගයන් පහත දක්වා ඇත.		
චලන අනුපාතය:		
කෙටිකල් ණය හා කෙටිකාලීන ණයගැනීම් වල ධාරණ අගයන්		-
		-
ස්ථාවර අනුපාතය		
කෙටිකල් ණය හා කෙටිකාලීන ණයවල ධාරණ අගයන්	18,381,397	13,455,505
	18,381,397	**13,455,505**
25.1 කාලීන ණය		
ජනවාරි 01 දිනට ශේෂය	13,455,505	**17,336,645**
වසරේ දී ගත් ණය	16,332,302	1,443,000
වසරේ ප්‍රතිගෙවීම්	(11,406,410)	(5,324,140)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**18,381,397**	**13,455,505**
ඉදිරි මාස 12 තුල කලයුතු ණය ගෙවීම් කොටස	4,925,892	3,881,140
ප්‍රවර්ථන වසරින් පසු ගෙවිය යුතු	13,455,505	9,574,365
	18,381,397	**13,455,505**
26 විශ්‍රාම ප්‍රතිලාභ සැළසුම් බැඳීම්		
ජනවාරි 01 දිනට ශේෂය	20,275,222	**20,368,822**
විස්තිරන ආදායමෙහි හඳුනාගත් වියදම්	9,418,925	3,101,401
වසර තුල සිදුකළ ගෙවීම්	(3,262,765)	(3,195,001)
SLFRS මූල්‍ය ප්‍රකාශන තෙක් කළ ප්‍රධාන ගැලපුම්		-
දෙසැම්බර් 31 දිනට ශේෂය	**26,431,382**	**20,275,222**
26.1 විස්තිරණ ආදායමෙහි හඳුනාගත් වියදම		
ප්‍රවර්ථන සේවා පිරිවැය	5,651,355.00	1,860,841
වසරේ පොලී අයකිරීම	3,296,624.00	1,085,490
ගිණුම්කරණ උපකල්පන වෙනස්වීමෙන් වන (ලාභ) /අලාභ	470,946.00	155,070
	9,418,925.00	**3,101,401**

අරමුදල මගින් ඇති කල මෙම උපකල්පන විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් ගණනය කිරීම සඳහා යොදන කළමනාකාරිත්වයේ විවිලාායන්හි තක්සේරු මත පදනම්වේ. වට්ටම් අනුපාතය දිගුකාලීන රාජ්‍ය ඇපකර වල වෙළඳපල අනුපාත පදනම මත තීරණය කෙරේ.

යොදාගත් ප්‍රධාන උපකල්පන පහත දැක්වේ.

වට්ටම් අනුපාතය [%]	10.75%	10.75%
ඉදිරි වැටුප් වැඩි කිරීම් - වැටුප [%]	2%	2%
සේවක පිරිවැටුම් සාධකය [%]	3%	3%
විශ්‍රාම වයස [අවු.]	55	55
27 වෙළඳ ණයහිමියන් හා වෙනත් ගෙවීමට ඇති දෑ		
වෙළඳ ණයහිමියෝ ගෙවීමට ඇති දෑ	220,242,249.00	165,231,638
වෙනත් ණයහිමියෝ ගෙවීමට ඇති දෑ	95,249,428.00	92,383,215
	315,491,677.00	**257,614,853**
28 ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ		
රැඳවුම් බද්ද (WHT)	3,599,202	2,203,302
	3,599,202	**2,203,302**

වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අවකරණ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන වල සටහන් පසු පිටට

පීඑල්ඒ/ඩී/ටීඑස්එෆ්/
01/2014/05

2017 ජනවාරි 07 දින

ලේකම්,
චැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

තේ ශක්ති අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

තේ ශක්ති අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනතේ 13(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2016 අගෝස්තු19 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට තේ ශක්ති අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

පසුගිය වර්ෂ 5 ක අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල සැලකීමේදී 2010 වර්ෂයේ රු.මිලියන 28.52 ක් වූ අලාභ තත්ත්වය 2012 වර්ෂයේදී හැර අනෙකුත් වර්ෂවල වැඩි වී 2014 වර්ෂයේදී රු.මිලියන127.82 ක් වී තිබුණි. අරමුදලට 2005 වර්ෂයට පෙර භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු එකතුව රු.මිලියන 437.5 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන 2012 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට පටහැනිව වාර්ෂිකව සියයට 10 බැගින් ආදායමට ගැලපීම නිසා ඉහත අලාභ තත්ත්වයන් අඩුවෙන් පෙන්නුම් කිරීමට හේතු වී තිබුණු අතර කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට ගෙවිය යුතුව තිබූ රු.මිලියන 74 ක් ආදායමට ගැනීම නිසා 2012 වර්ෂයේදී ලාභදායී තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි.

අරමුදලේ ශුද්ධ වත්කම් සැලකීමේදී 2010 වර්ෂයේ දී රු.මිලියන 651.31 ක් වූ අතර 2013 වර්ෂයේදී රු.මිලියන 55.41 දක්වා අඩුවී 2014 වර්ෂයේදී රු. මිලියන 72.42 ක ශුද්ධ වගකීම් තත්ත්වයක් බවට පත්වී තිබුණි. එසේම අරමුදල සතුව පැවති කම්හල්වල නිෂ්පාදනය කටයුතු 2016 ජූලි වන විට නතර කර තිබූ අතර මාස දෙකක සේවක පාරිශ්‍රමික ගෙවා නොතිබුණි. මේ අනුව රජයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව අරමුදල පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවක් පවතින බව නිරීක්ෂණය විය.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ප්‍රමිතියක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර ආදායම් සහ වියදම් සමඟ හිලව් නොකළයුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල බදු කුලී ආදායමින්, නඩත්තු වියදම් අඩු කර ශුද්ධ බදු ආදායම රු. 1,208,010 ක් වෙනත් ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

ප්‍රත්‍යාගණන වත්කමක සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට තවත් ප්‍රත්‍යාගණනයක් සිදුකළ යුතු නමුත් අරමුදලේ ස්ථාවර වත්කම් 2006 වසරෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ පිරියත හා යන්ත්‍ර වලට අදාල ක්ෂය රු.588,624 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල ඇතුළත් එකතුව රු. 263,052,111 ක්වූ ලැබිය යුතු ශේෂ හා එකතුව රු.315,491,677 ක් වූ ගෙවිය යුතු ශේෂ සම්බන්ධව වයස් විශ්ලේෂණ හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

බැංකු ගිණුම් 02 කට අදාලව අතින් පිළියෙල කරන ලද මුදල් පොත හා පරිගණක මුද්‍රිත මුදල් පොත අතර එකතුව රු.96,450 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස්කම් හඳුනා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේදී බුලත්කොහුපිටිය හා පොතුපිටිය තේ කර්මාන්තශාලා ඉදිකිරීමට ලබා දී තිබූ එකතුව රු.18,042,351 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම කර්මාන්තශාලා ඉදිකිරීම්ද අතරමඟ නවතා දමා තිබුණි.

(ආ) 2005 වර්ෂයේ යටිනුවර කර්මාන්තශාලාව ඉදිකිරීම පුද්ගලික සමාගමකට ලබා දී තිබූ අතර එම සමාගම විසින් කරුමාන්තශාලා ඉදිකිරීම අතරමඟ නවතා දැමීම නිසා ගෙවන ලද රු.10,269,400 ක අත්තිකාරම් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට හිනිදුම තේ කම්හල කළුබෝවිටියාන තේ සමාගම වෙත බදු පදනම මත පවරාදී තිබූ අතර අරමුදලට ලැබිය යුතු රු.1,661,828 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) තේ ශක්ති අරමුදලට අයත් කම්හල්වල භාවිතය සඳහා කුඩා තේ වතු සමිතිවලට ලබා දී තිබූ ලොරි රථ වෙනුවෙන් අයවිය යුතු රු.2,099,029 ක් වූ ණය ශේෂය 2013 වර්ෂයේ සිට අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

2.4 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

	නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදයේ 13.3 වගන්තිය	වැඩ බැලීමේ පත්වීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක්, තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද අරමුදලේ ගණකාධිකාරී තනතුර සහ පොත් තබන්නා තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් දෙදෙනෙකු පිළිවෙලින්, 2012 සහ 2010 වර්ෂයේ සිට පත්කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.

(i)	මුදල් රෙගුලාසි 110	පාඩු හා හානි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 396	බැංකු ගිණුම් 03 කට අදාලව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 6 ඉක්මවූ එකතුව රු.179,138 ක් වූ චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ)	2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පරිගණක හා මෘදුකාංග සඳහා චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2014 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.127,823,734 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.59,365,788 ක වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.68,457,946 ක එනම් සියයට 115 ක පිරිහීමක් නිරීක්ෂණය විය. විකුණුම් පිරිවැය රු.91,316,313 කින් අඩු වුවද වර්ෂයේ ආදායම රු.151,443,765 කින් අඩුවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 අරමුදලට එරෙහිව හෝ අරමුදල විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලට අයවිය යුතු රු.9,409,291 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ කම්හල් 10 කට එරෙහිව අධිකරණවල නඩු 10 ක් ගොනුකර තිබූ අතර, අරමුදලේ අලෙවි අංශයේ රු.250,019 ක මුදල් වංචාවක් සම්බන්ධව කොළඹ දිසා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

(ආ) අරමුදලට අයවිය යුතු රු.19,211,584 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් බාහිර ආයතනයකට විරුද්ධව නඩු පවරා තිබූ අතර 2014 ජූනි 20 දින අරමුදලට වාසිදායක ලෙස තීන්දුව ලබා දී ඇතත් විත්තිය විසින් 2014 අගෝස්තු 20 දින කොළඹ වාණිජ මහාධිකරණයේ අභියාචනා නඩුවක් ගොනුකර තිබුණි.

(ඇ) සේවකයන් විසින් අරමුදලට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ නඩු 4 ක් ගොනුකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කම්හල් ලාභ/අලාභ

අරමුදල සතු කම්හල් 14 ක් පැවති අතර ඉන් කම්හල් 10 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරීව පැවතුණි. එම කම්හල් තුළින් සමාලෝචිත වර්ෂයේදී ලද අලාභය (ප්‍රධාන කාර්යාලයේ වියදම් හැර) රු.115,482,937 ක් වූ අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී රු.69,730,592 කින් එනම් සියයට 152 කින් වැඩිවී තිබුණි. 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාකාරී තත්ත්වයේ පැවති කර්මාන්තශාලා ලැබූ ලාභ/ අලාභ තත්ත්වයන් පහත දැක්වේ.

කම්හල	ලාභාලාභ තත්ත්වය : '000				
	2014	2013	2012	2011	2010
	රු.	රු.	රු.	රු.	රු.
දෙනියාය	(11,913)	(7,777)	(7,349)	(4,126)	1,054
වලහන්දුව	(14,068)	731	(2,297)	(3,312)	९९९

මාවරල	(10,279)	(10,229)	(6,108)	(3,653)	158
ඇල්පිටිය	(13,482)	(3,409)	(7,990)	(16,604)	(10,105)
රයිගම්කෝරලය	(15,885)	(7,479)	(7,579)	2,191	7,670
කොත්මලේ	(9,683)	(6,933)	(6,132)	(8,901)	(11,348)
කැප්පෙටිපොල	(5,628)	5,421	(1,285)	(5,223)	1,239
පස්සර	(1,769)	5,772	6,640	2,345	6,342
මහවැලි	(10,054)	(13,079)	(899)	245	(2,738)
දැරනියගල	(22,722)	(8,770)	(3,989)	-	-
	(115,483)	(45,752)	(36,988)	(37,038)	(7,170)

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයේ වලහන්දුව, කැප්පෙටිපොළ හා පස්සර කර්මාන්තශාලා තුන ලාභ ලබා තිබුණද සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී කම්හල් 10 ම අලාභ ලබා තිබුණි. එමෙන්ම 2010 වර්ෂයේ සිට කොත්මලේ තේ කම්හල හා 2012 වර්ෂයේ ආරම්භ කරන ලද දැරණියගල කර්මාන්ත ශාලාවද අඛණ්ඩව අලාභ ලබා තිබුණි.

(ii) කම්හල් අලාභය අවම කිරීම සඳහා වැඩි දළු ප්‍රමාණයක් මිලදී ගැනීමේ අරමුණින් තේ දළු සඳහා වැඩි මිලක් ගෙවා තේ දළු මිලදී ගෙන තිබුණද මෙම අරමුණ ඉටු නොවී පැවති අතර අමතර පිරිවැය දැරීමෙන් පිරිවැය ඉහළ යාමක් පමණක් සිදු වී තිබුණි.

(ආ) තේ නිෂ්පාදනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

	2014	2013	වැඩිවීම/ අඩුවීම	වෙනස් වීමේ ප්‍රතිශතය
මිලදී ගන්නා ලද අමු තේ දළු (කිලෝ ග්‍රෑම්)	8,084,257	10,118,528	2,034,271	20.10
නිෂ්පාදිත තේ ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	1,697,683	2,123,142	425,459	20.04
කිලෝ ග්‍රෑම් 1 ක නිෂ්පාදිත පිරිවැය රු.	435.27	471.11	35.86	7.61
කිලෝ ග්‍රෑම් 1 ක ශුද්ධ සාමාන්‍ය විකුණුම් මිල රු.	399.47	411.10	11.63	2.91
පිහිටීම මත කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝවක සාමාන්‍ය විකුණුම් මිල රු.	461.86	444.42		

(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී, කම්හල් මගින් මිලදී ගන්නා ලද අමු තේ දළු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 2,034,271 කින් අඩු වී තිබුණු අතර කම්හල්වල සමස්ත නිෂ්පාදිතය සියයට 20.04 කින් පහත වැටී තිබුණි. මාවරල, රයිගම්කෝරළේ හා දැරණියගල තේ කම්හල්වල තේ නිෂ්පාදනය වැඩිවී තිබුණද අනෙක් සියළුම කම්හල්වල සියයට 18 සිට සියයට 53 දක්වා වූ පරාසයක තේ නිෂ්පාදනය අඩු වී තිබුණි.

(ii) තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය සියයට 7.61 කින් ඉහළ ගොස් තිබූ අතර ශුද්ධ විකුණුම් මිල සියයට 2.9 කින් අඩු වී තිබුණි. අරමුදලට අයත් සියළුම කම්හල්වල, තේ කිලෝවක නිෂ්පාදන පිරිවැයට වඩා ශුද්ධ විකුණුම් මිල අඩු වටිනාකමක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(iii) ඉකුත් වර්ෂ 5 හි කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝවක සමස්ථ සාමාන්‍ය මිල අරමුදලේ කම්හල් වල සාමාන්‍ය විකුණුම් මිල හා සැසඳීමේදී අඩුවීමක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තා අනුව තේ කර්මාන්තශාලාවල තේ නිෂ්පාදනය පහත පරිදි වේ.

කම්හල	ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත අමු තේ දළු මිලදී ගැනීම. (කිලෝ ග්‍රෑම්)	තථ්‍ය තේ දළු මිලදී ගැනීම. (කිලෝ ග්‍රෑම්)	ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත තේ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)	තථ්‍ය තේ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)	ප්‍රගතිය ප්‍රතිශතය
දෙනියාය	1,500,000	713,628	322,500	146,651	45.47
වලහන්දුව	1,500,000	683,708	322,500	141,814	43.97
මාවරල	1,110,000	267,805	238,650	55,382	23.21
ඇල්පිටිය	1,500,000	497,958	322,500	102,435	31.76
රයිගම්කෝරලය	1,950,000	1,538,794	419,250	316,688	75.54
දැරණියගල	1,500,000	1,222,146	322,500	250,966	77.82
කොත්මලේ	1,168,000	389,658	251,100	80,351	31.40
කැප්පෙට්ටිපොළ	1,800,000	965,544	392,400	206,235	52.56
පස්සර	1,650,000	948,651	363,000	209,097	57.60
මහවැලි	1.800.000	856.455	387.000	188.064	48.60
එකතුව	15.478.000	8.084.257	3.341.400	1.697.683	

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අමු තේ දළු කිලෝ ග්‍රෑම් 15,478,000 ක් මිලදී ගැනීමට අපේක්ෂා කළද මිලදී ගෙන තිබුණේ තේ දළු කිලෝ ග්‍රෑම් 8,084,257 ක් එනම් සියයට 52.23 කි. එබැවින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 3,341,400 ක් වූවද තථ්‍ය නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 1,697,683 ක් එනම් සියයට 50.81 ක් පමණක් විය. කම්හල් වශයෙන් සැලකූ විට කාර්යසාධනය දැරණියගල හා රයිගම්කෝරළයේ කම්හල් හැර සියයට 23 සිට සියයට 58 දක්වා වූ පරාසයක පැවතුණි.

(ඇ) දේශීය තේ අලෙවි අංශය

සමාලෝචිත වර්ෂයේ දේශීය තේ අලෙවි අංශයේ රු.6,794,010 ක තේ අලෙවියක් අත්කර ගැනීමට ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කර තිබුණද තථ්‍ය අලෙවිය රු.2,848,418 ක් වූ අතර එය ඉලක්කගත ප්‍රමාණයේන් සියයට 42 ක් පමණක් විය.

(ඉ) පොහොර අංශය

සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත පොහොර අලෙවිය මෙට්‍රික් ටොන් 8,525 ක් වූවද තථ්‍ය අලෙවිය මෙට්‍රික් ටොන් 1,440 ක් එනම් සියයට 16.89 ක් පමණක් විය.

(ඊ) සුභසාධන අංශය

තේ ශක්ති අරමුදල මඟින් පවත්වා ගෙන යනු ලබන කුඩා තේ වතු සමිති සාමාජිකයන්ගේ සුභසාධන අරමුදලින් තේ ශක්ති කම්හල්වල පවතින මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීම සඳහා 2000 සිට 2003 දක්වා වූ කාලපරිච්ඡේදයේදී රු. 118,300,000 ක ණය මුදලක් අරමුදලේ කම්හල්වලට ලබාදී තිබුණද කම්හල් විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම ණය මුදල් පියවා නොතිබුණි. කම්හල් අංශය අබණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ණය මුදල හා රු.50,968,658 ක පොලිය ලබා ගැනීමේ අවිනිශ්චිතතාවයක් නිරීක්ෂණය විය.

(උ) 2014 දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන් 94,425 දෙනෙකු සතුව රු.206,014,150 ක් වටිනා කොටස් හිමියන් සඳහා 2007 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂයේ දක්වා ලාභාංශ ගෙවා නොතිබුණි. සාමාජික කොටස් හිමියන්ගේ කොටස් ප්‍රාග්ධන වටිනාකම ඉහළ දැමීම මඟින් කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික හා සමාජ පැවැත්මේ අභිවර්ධනයට කැපවූ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම ආයතනයේ දැක්ම වුවත් ඉහත සඳහන් කරුණු අනුව එම අරමුණ ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 12 ක කාලයක සිට අරමුදල යටතේ ක්‍රියාත්මක මහවැලි අධිකාරියට අයත් කොත්මලේ තේ කර්මාන්තශාලාව සම්බන්ධයෙන් විධිමත් බදු ගිවිසුමකට එළඹ නොතිබුණි. එසේ වුවද 2007 ජූනි 21 දිනැති අංක අමප/07/1906/309/019 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම කම්හල හා ඊට අයත් ඉඩම හා වතු බංගලාව දීමනාකරයකින් පවරා ගැනීමට අනුමැතිය දී ඇතත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2008 වර්ෂයේ සිට 2014 වර්ෂයේ අවසානය දක්වා රු. 5,084,970 ක් බදු මුදල් හා දඩ වශයෙන් ගෙවා නිබුණි.

(ආ) අරමුදලෙහි ගිණුම් වල දක්වා තිබූ පිරිවැය රු. 8,512,921 ක් වූ කුඩා තේ වතු සමිතිවලට අයත් වාහන 09 ක අයිතිය අරමුදලට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කළමනාකරණයේ දුර්වල අධීක්ෂණයක් පැවතීම හේතුවෙන් බලංගොඩ කම්හල වසා දැමීමෙන් පසු ඉඩම් කොටස් 6 කට අදාල පර්චස් 18.59 ක බිම් ප්‍රමාණයක් බාහිර පාර්ශවයක් විසින් අත්පත් කරගෙන තිබූ අතර මේ සම්බන්ධයෙන් බලංගොඩ දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ එකතුව රු.1,403,526ක් වූ ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව දේශීය ආදයම් දෙපාර්තුමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය වූ රු.3,415,813 න් හිලව් කරගැනීමට කටයුතු නොකර වර්ෂය අවසානයට ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලට අයත් පොහොර ගබඩා පරිශ්‍රයේ පොහොර මිශ්‍ර කිරීම සඳහා 2006 වර්ෂයේදී රු. 2,197,447 ක් වූ පොහොර මිශ්‍රණ යන්ත්‍රයක් මිලදීගෙන තිබූ නමුත් මිශ්‍ර කිරීමේ වියදම හා ඒ සඳහා ගතවන කාලය ඉහළ මට්ටමක පැවතීම නිසා එම යන්ත්‍රය භාවිතයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) බලංගොඩ කම්හල වසා දැමීමෙන් පසු ගොඩනැගිලි නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් කම්හලට අයත් නිල නිවාසය හා වැසිකිළි පද්ධතිය විනාශවෙමින් තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.1,350,000 ක් වූ බලංගොඩ කම්හල පිහිටි ඉඩම හා වටිනාකම රු.10,000,000 ක් වූ ගොඩනැගිලි කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) අරමුදලේ ප්‍රධාන කාර්යාලය හා සියලුම කම්හල් ඒකාබද්ධව ගිණුම් සැකසීම සඳහා වටිනාකම රු.2,435,000 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධතියක් 2010 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද, ගිණුම් සැකසීමේ කටයුතු සඳහා 2016 ජූනි 20 දින වන විටත් එය භාවිතා කර නොතිබුණි.

4.4 දෘෂ්‍ය අක්‍රමිකතා :

ඇල්පිටිය තේ කර්මාන්ත ශාලාවේ රු. 1,669,613 ක් වටිනා තේ තොග හිඟය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 විසිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම.

කම්හල් ගොඩනැගිලි වටිනාකම රු.62,391,999 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද එම ගොඩනැගිලි පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගැනීමට අරමුදල විසින් 2016 ජූනි 30 දක්වා කටයුතු කර නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය 90 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 60 ක් වීමෙන් පුරප්පාඩු 30 ක් වූ අතර ඒ තුළ මාණ්ඩලික නිලධාරීන් 14 ක් විය. අනුමත කම්හල් කාර්ය මණ්ඩලය 199 ක් හා තථ්‍ය කම්හල් කාර්ය මණ්ඩලය 79 ක් වීමෙන් පුරප්පාඩු 120 ක් වූ අතර ඒ තුළ තාක්ෂණ නිලධාරීන් 19 ක එනම් සියයට 53 ක පුරප්පාඩු පැවතුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2003 ජූනි 2 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 ඡේදය පරිදි මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2016 අප්‍රේල් 29 දිනදීය. තවද කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2016 ඔක්තෝබර් 20 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

අරමුදලේ අයවැය ලේඛනයට අනුව අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 39 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු විය.

(අ) ගිණුම්කරණය
(ආ) මුල්‍ය පාලනය
(ඇ) කර්මාන්තශාලා මෙහෙයුම්
(ඈ) වත්කම් උපයෝජනය
(ඉ) වාහන පාලනය
(ඊ) තොග පාලනය

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති